රහස්‍ය ලේඛනයකි

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව


## අ.පො.ස. (උ. පෙළ) විභාගය - 2020

# 21 - ආර්ථික විද්‍යාව

# නව නිර්දේශය

## ලකුණු දීමේ පටිපාටිය

මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය




මෙය උත්තර පත්‍ර පරීක්ෂවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂකවරුන් සමග සාකච්ඡා පැවැත්වෙන අවස්ථාවේ දී ඉදිරිපත් වන අදහස් අනුව මෙහි ඇතැම් වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

සියලුම හිමිකම් ඇවිරිණි.

Visit EDUHUB

# පටුන



| | පිටුව | | |
|---|---|---|---|
| | සිට | | දක්වා |
| ප්‍රශ්න පත්‍ර ව්‍යුහය | | | |
| ආර්ථික විද්‍යාව I | 03 | - | 10 |
| ආර්ථික විද්‍යාව I සඳහා ලකුණු දීමේ පටිපාටිය | 11 | - | 11 |
| ආර්ථික විද්‍යාව II සඳහා ලකුණු දීමේ පටිපාටිය | 12 | - | 45 |
| සටහන් | 46 | | |





Visit EDUHUB

# (21) ආර්ථික විද්‍යාව

## ප්‍රශ්න පත්‍ර ව්‍යුහය

**I** පත්‍රය - කාලය පැය 02 යි.
වරණ 05 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 50 කි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුයි. එක් ප්‍රශ්නයකට ලකුණු 02 ක බැගින් මුළු ලකුණු 100 කි.

**II** පත්‍රය - කාලය පැය 03 යි.
මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත ය.
(අ) උප කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 5 කි.
(ආ) උප කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 5 කි.

අවම වශයෙන් එක් කොටසකින් ප්‍රශ්න 2 බැගින් තෝරා ගෙන ප්‍රශ්න 5 කට පිළිතුරු සැපයිය යුතුයි. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් මුළු ලකුණු 100 කි.

අවසාන ලකුණු ගණනය කිරීම : **I** පත්‍රය 100

**II** පත්‍රය 100

අවසාන ලකුණු 200 ÷ 2 = 100



Visit EDUHUB

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

| | | | |
|---|---|---|---|
| ආර්ථික විද්‍යාව I<br>பொருளியல் I<br>Economics I | 21 S I | | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two hours |

උපදෙස්
* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පසුපිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි** හෝ **ඉතාමත් ගැළපෙන** හෝ පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**

1. නොමිල භාණ්ඩයක (free good) දක්නට ලැබෙන්නේ පහත දැක්වෙන කවර ලක්ෂණය ද?
   (1) එම භාණ්ඩයට ඇති ඉල්ලුමට සාපේක්ෂව කිසියම් හිඟකමක් දක්නට ලැබේ.
   (2) එම භාණ්ඩය සැපයීමේ ආවස්ථික පිරිවැයක් නොමැත.
   (3) එම භාණ්ඩයේ පරිභෝජනය හෝ නිෂ්පාදනය හෝ කිසිදු බාහිරතාවක් ජනනය නොකරයි.
   (4) එම භාණ්ඩය රජය විසින් ගාස්තුවක් අයකිරීමකින් තොරව සපයනු ලැබේ.
   (5) එම භාණ්ඩයේ පරිභෝජනය සමාජයීය වශයෙන් හිතකර බැවින් එය රජය විසින්ම සපයනු ලැබේ.

2. ආර්ථික විද්‍යාඥයින් 'ප්‍රාග්ධනය' යන පදයෙන් සුවිශේෂ වශයෙන් අදහස් කරනුයේ
   (1) වෙනත් භාණ්ඩ සහ සේවාවන් නිෂ්පාදනය කිරීම උදෙසා මිනිසා විසින් නිෂ්පාදනය කරන ලද භාණ්ඩයන් ය.
   (2) ව්‍යාපාර වස්තු (stocks) සහ පිළිනපත් ස්වරූපයෙන් ප්‍රාග්ධනය මිලයට ගැනීමට යොදා ගනු ලැබූ මුදල් ය.
   (3) ප්‍රාග්ධනය මිලයට ගැනීමේ අරමුණින් කුටුම්බ විසින් සමුච්චනය කරගනු ලැබූ ඉතුරුම් ය.
   (4) ප්‍රාග්ධනය මිලයට ගැනීම සඳහා ව්‍යවසායකයෙක් විසින් භාවිත කරන ලද මුදල් ය.
   (5) මූර්ත දේපල, වනාන්තර, ලෝහ සහ ඛනිජ සම්පත් ය.

3. 'සෑම ආර්ථික පද්ධතියක්ම හිඟකම පිළිබඳ ප්‍රශ්නයට මුහුණ දේ' යන ප්‍රකාශයෙන් කවරක් අදහස් වේ ද?
   (1) සමාජයේ දක්නට ඇති ඇතැම් සම්පත්වල ප්‍රමාණයන් ඒවාට ඇති ඉල්ලුම ද ඉක්මවා යන බව ය.
   (2) රටක ඛනිජ නිධි දක්නට ලැබෙනුයේ ඉතා නිශ්චිත ප්‍රමාණයකින් පමණක් බව ය.
   (3) සම්පත් හිඟකම නිසා පූර්ණ සේවා නියුක්තිය අත්කර ගැනීමට රටවල් අසමත් වී සිටින බව ය.
   (4) සමාජයේ සියලු වුවමනා සපුරාලීමට තරම් ඵලදායි සම්පත් ප්‍රමාණවත් නොවන බව ය.
   (5) ආර්ථික පද්ධති වරින් වර චක්‍රීය ප්‍රසාරණ අවධිවලට මුහුණ දෙන අතර එවැනි අවස්ථාවල දී සම්පත් හිඟකම හටගන්නා බව ය.

4. නිෂ්පාදන හැකියා වක්‍රයක් මත සම්පත් බෙදා වෙන්කිරීමේ කාර්යක්ෂමතා ලක්ෂ්‍යය අත්කරගත හැකි වනුයේ
   (1) අවම යෙදවුම් ප්‍රමාණයක් භාවිත කරමින් එක් එක් භාණ්ඩය නිෂ්පාදනය කරන විට දී ය.
   (2) ආන්තික ප්‍රතිලාභ ආන්තික පිරිවැයට සමාන වන මට්ටමට එක් එක් භාණ්ඩය නිෂ්පාදනය කරන විට දී ය.
   (3) පාරිභෝගික භාණ්ඩවලට සාපේක්ෂව ප්‍රාග්ධන භාණ්ඩ විශාල ප්‍රමාණයක් නිෂ්පාදනය කරන විට දී ය.
   (4) ප්‍රාග්ධන භාණ්ඩවලට සාපේක්ෂව පාරිභෝගික භාණ්ඩ විශාල ප්‍රමාණයක් නිෂ්පාදනය කරන විට දී ය.
   (5) භාණ්ඩයේ මිල ආන්තික ප්‍රතිලාභ ඉක්මවා යන මට්ටමේ දී එක් එක් භාණ්ඩය නිෂ්පාදනය කරන විට දී ය.

5. ඉල්ලුම් නීතිය මගින් ප්‍රකාශ කෙරෙනුයේ,
   (1) භාණ්ඩයක මිල අඩුවීමක් එම භාණ්ඩය සඳහා ඇති ඉල්ලුම් වක්‍රය වමට විතැන් කරන බව ය.
   (2) අනිකුත් කරුණු නොවෙනස්ව තිබිය දී කිසියම් භාණ්ඩයක මිල ඉහළ යත්ම, එම භාණ්ඩයෙන් ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය පහළ යන බව ය.
   (3) අනිකුත් කරුණු නොවෙනස්ව තිබිය දී කිසියම් භාණ්ඩයක මිල ඉහළ යත්ම, එම භාණ්ඩයෙන් ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය ඉහළ යන බව ය.
   (4) භාණ්ඩයක මිල අඩුවීමක් එම භාණ්ඩය සඳහා ඇති ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් කරන බව ය.
   (5) භාණ්ඩයක මිල ඉහළ යාමක් එම භාණ්ඩය සඳහා ඇති ඉල්ලුම් වක්‍රය වමට විතැන් කරන බව ය.



Visit EDUHUB

6. කිසියම් භාණ්ඩයක් ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය,
   (1) යම්කිසි මිලක දී පාරිභෝගිකයන් විසින් මිල දී ගැනීමට සැලසුම් කරනු ලබන ප්‍රමාණයයි.
   (2) එම භාණ්ඩයේ මිලෙන් සහ පාරිභෝගියාගේ ආදායම් මට්ටමෙන් ස්වාධීන වුවකි.
   (3) පාරිභෝගිකයින්ගේ මිල දී ගැනීමේ සැලසුම්වලින් ස්වාධීන වුවකි.
   (4) සැමවිටම සමතුලිත ප්‍රමාණයට සමාන වේ.
   (5) විවිධ මිලයන්හි දී පාරිභෝගිකයන් විසින් මිල දී ගැනීමට කැමති ප්‍රමාණයන් ය.

7. X භාණ්ඩයෙහි සැපයුම් කරනු ලබන ප්‍රමාණය වැඩි වීමට පහත සඳහන් කවරක් හේතු වේ ද?
   (1) අනිකුත් කරුණු නොවෙනස්ව තිබිය දී X භාණ්ඩයෙහි මිල ඉහළ යාමක්
   (2) X භාණ්ඩය නිෂ්පාදනය කිරීමේ දී අනුපූරක භාණ්ඩයක් ලෙස ක්‍රියා කරන Y භාණ්ඩයෙහි මිල ඉහළ යාමක්
   (3) X භාණ්ඩය නිෂ්පාදනය කිරීමට භාවිත කෙරෙන තාක්ෂණයේ වැඩි දියුණු වීමක්
   (4) X භාණ්ඩය නිෂ්පාදනය කිරීමට භාවිත කෙරෙන සම්පත්වල මිල පහළ බැසීමක්
   (5) X භාණ්ඩය සඳහා වන ආදේශක භාණ්ඩයක ඉල්ලුමෙහි අඩු වීමක්

8. තරගකාරී වෙළෙඳපොළක ඉල්ලුම සහ සැපයුම යන දෙකම වැඩි වුවහොත්, සමතුලිත මිල සහ ප්‍රමාණය මත කෙබඳු බලපෑමක් හටගනී ද?
   (1) නිශ්චිත වශයෙන්ම මිල ඉහළ යන නමුදු ප්‍රමාණය වැඩි වීමට හෝ අඩු වීමට හෝ නොවෙනස්ව තිබීමට හෝ පිළිවන.
   (2) නිශ්චිත වශයෙන්ම ප්‍රමාණය ඉහළ යන නමුදු, මිල ඉහළ නැගීමට හෝ පහළ බැසීමට හෝ නොවෙනස්ව තිබීමට හෝ පිළිවන.
   (3) නිශ්චිත වශයෙන්ම ප්‍රමාණය පහළ යන නමුදු, මිල ඉහළ නැගීමට හෝ පහළ බැසීමට හෝ නොවෙනස්ව තිබීමට හෝ පිළිවන.
   (4) නිශ්චිත වශයෙන්ම මිල පහළ යන නමුදු, ප්‍රමාණය වැඩිවීමට හෝ අඩු වීමට හෝ නොවෙනස්ව තිබීමට හෝ පිළිවන.
   (5) නිශ්චිත වශයෙන්ම මිල හා ප්‍රමාණය යන දෙකම ඉහළ නගී.

9. එක්තරා පාරිභෝගික භාණ්ඩයක් සඳහා ඇති වෙළෙඳපොළ ඉල්ලුම් ශ්‍රිතය $Q_D = 500 - 5P$ යයි සලකන්න. රුපියල් 20ත් රුපියල් 30ත් අතර මිල පරාසයේ දී මෙම භාණ්ඩය සඳහා ඇති ඉල්ලුමෙහි චාප මිල නම්‍යතාව කොපමණ වේ ද?
   (1) −0.25   (2) −0.33   (3) −0.43   (4) −0.52   (5) −0.66

10. කිසියම් රටක ජාතික ආපදාවක් පවතින අවස්ථාවක, එරට ළිළවළු ගොවීහු තම ත්‍යාගශීලිත්වය පෙන්නුම් කරමින් පාරිභෝගිකයන්ට අවශ්‍යතරම් එළවළු, තරගකාරී සමතුලිත වෙළෙඳපොළ මිලෙන් හරි අඩකට අලෙවි කිරීමට තීරණය කරති. මෙම ක්‍රියාවේ ප්‍රතිඵලයක් වශයෙන්
   (1) ආර්ථික අතිරික්තය පහළ වැටෙනු ඇත.   (2) ආර්ථික අතිරික්තය ඉහළ නගිනු ඇත.
   (3) ආර්ථික අතිරික්තය නොවෙනස්ව පවතිනු ඇත.   (4) පාරිභෝගික අතිරික්තය පහළ වැටෙනු ඇත.
   (5) නිෂ්පාදක අතිරික්තය ඉහළ නගිනු ඇත.

11. කිසියම් භාණ්ඩයක මිල වෙනස්වීමක ආදායම් ප්‍රතිවිපාකය ඍණ අගයක් ගනු ලැබුවත්, ආදේශන ප්‍රතිවිපාකය වඩා බලවත් වේ නම්, එම භාණ්ඩය
   (1) ගිෆන් භාණ්ඩයක් වේ.   (2) සාමාන්‍ය භාණ්ඩයක් වේ.
   (3) අත්‍යවශ්‍ය භාණ්ඩයක් වේ.   (4) බාල භාණ්ඩයක් වේ.
   (5) සුඛෝපභෝගී භාණ්ඩයක් වේ.

12. කිසියම් වෙළෙඳපොළක උපරිම මිලක් පනවා ඇති විට,
   (1) අඛණ්ඩ භාණ්ඩ හිඟයක් හටගනී.
   (2) අඛණ්ඩ භාණ්ඩ අතිරික්තයක් හටගනී.
   (3) භාණ්ඩය අලෙවිකරන්නන්ට වඩාත් වාසිදායක වේ.
   (4) කිසිවෙකුටවත් වාසියක් ඇති නොවේ.
   (5) ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණයට වඩා සැපයුම් කරනු ලබන ප්‍රමාණය විශාල වේ.

13. ගොවිපොළ නිෂ්පාදිත මත සඵල අවම මිලයන් නියම කිරීම ආශ්‍රයෙන් පැන නැගෙන ප්‍රශ්නයක් **නොවනුයේ** පහත සඳහන් කවරක් ද?
   (1) බරපතළ ආකාරයේ අධි සැපයුමක් වෙළෙඳපොළෙහි හටගැනීම
   (2) කෘෂිකාර්මික නොවන බදු ගෙවන්නන් වෙතින් ගොවි ජනයා වෙත ආදායම සංක්‍රාම වීම
   (3) රජය විසින් විශාල සහනාධාර ප්‍රමාණයක් ලබාදීම
   (4) පාරිභෝගිකයන් ගෙවන මිල ඉහළ යාම
   (5) කෘෂිකාර්මික භාණ්ඩ සඳහා කළු කඩ ඇති වීම



Visit EDUHUB

**14.** තරගකාරී වෙළෙඳපොළක අලෙවි කෙරෙන භාණ්ඩයක් සඳහා වෙළෙඳපොළ ඉල්ලුම් ශ්‍රිතය, $Q_D = 180 - 2P$ සමීකරණයෙන් දැක්වේ. වෙළෙඳපොළ සමතුලිත මිල රුපියල් 65ක් වේ නම්, පාරිභෝගික අතිරික්තයෙහි අගය

(1) රුපියල් 625 කි.   (2) රුපියල් 1 000 කි.
(3) රුපියල් 1 250 කි.   (4) රුපියල් 3 250 කි.
(5) රුපියල් 4 500 කි.

**15.** වැඩිවන පරිමාණානුකූල ඵල තාක්ෂණික ලක්ෂණයක් පිළිබිඹු කරන අතර, එහි දී ආයතනයේ නිමැවුම වැඩිවීමේ ප්‍රතිශතය,

(1) ආයතනය යෙදවුම් වැඩිකරන ප්‍රතිශතය ඉක්මවා යයි.
(2) ආයතනය යෙදවුම් වැඩිකරන ප්‍රතිශතයට වඩා අඩු ය.
(3) ආයතනය යෙදවුම් වැඩිකරන ප්‍රතිශතයට සමාන වේ.
(4) ආයතනය ස්ථාවර යෙදවුම් වැඩිකරන ප්‍රතිශතය ඉක්මවා යයි.
(5) ආයතනය ස්ථාවර යෙදවුම් වැඩිකරන ප්‍රතිශතයට වඩා අඩු ය.

**16.** පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය කවරක් ද?

(1) ආර්ථික ලාභය = ගිණුම්කරණ ලාභය
(2) ආර්ථික පිරිවැය = ප්‍රත්‍යක්ෂ (ඍජු) පිරිවැය + ආරෝපිත (ගම්‍ය) පිරිවැය
(3) ආර්ථික පිරිවැය = ප්‍රත්‍යක්ෂ (ඍජු) පිරිවැය – ආරෝපිත (ගම්‍ය) පිරිවැය
(4) ආවස්ථික පිරිවැය = ආර්ථික ලාභය
(5) ගිණුම්කරණ පිරිවැය = ආරෝපිත (ගම්‍ය) පිරිවැය

**17.** කතිපයාධිකාරී වෙළෙඳපොළක අවශ්‍යම ලක්ෂණයක් වනුයේ පහත සඳහන් කවරක් ද?

(1) වෙළෙඳපොළ අබාධ ප්‍රවේශය සහ අබාධ පිටවීම
(2) මහා පරිමාණ නිෂ්පාදකයන් අතලොස්සක් සිටීම
(3) කිට්ටු ආදේශක නොමැති භාණ්ඩයක් නිෂ්පාදනය කරන එක් නිෂ්පාදකයෙක් පමණක් සිටීම
(4) සමජාතීය නිෂ්පාදිතයක් තිබීම
(5) ආයතන අතර රහසිගත එකඟතාවක් සඳහා අවස්ථා නොමැතිවීම

**18.** ආයතනයක් තම නිෂ්පාදිතය සඳහා පූර්ණ නම්‍ය ඉල්ලුම් වක්‍රයකට මුහුණ දෙනු ලැබේ නම්,

(1) එම ආයතනය මිල ගනුවෙක් නොවේ.
(2) අලෙවිය වැඩි කරගැනීම සඳහා මිල පහළ හෙළීමට හැකියාවක් ආයතනයට ඇත.
(3) මුළු අයභාරය වැඩි කරගැනීම සඳහා මිල ඉහළ දැමීමට හැකියාවක් ආයතනයට ඇත.
(4) ආයතනයේ ආන්තික අයභාර වක්‍රය වෙළෙඳපොළ මිලේ දී තිරස් රේඛාවක් වේ.
(5) ආයතනය සැමවිට ම ශූන්‍ය ආර්ථික ලාභ උපයයි.

**19.** නිමැවුමේ දළ වටිනාකම (GVO) සහ දළ එකතු කළ අගය (GVA) අතර වෙනස වනුයේ

(1) ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනයයි.   (2) අතරමැදි පරිභෝජනයයි.
(3) ශුද්ධ වක්‍ර බදු ය.   (4) ශුද්ධ ප්‍රාථමික ආදායම ය.
(5) ප්‍රාථමික යෙදවුම් ය.

**20.** ජාතික ගිණුම්කරණයේ දී පහත සඳහන් ක්‍රියාකාරකම් අතුරින් කවරක් නිෂ්පාදන ඉමෙන් බැහැර කෙරේ ද?

(1) බලපත්‍ර රහිත වෛද්‍ය වෘත්තිකයන්ගේ සේවා
(2) අයිතිකරුවාම පදිංචි නිවාසවලින් ලැබෙන සේවා
(3) කුටුම්බ විසින් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ
(4) ගාස්තු අයකිරීමකින් තොරව රජය විසින් අධ්‍යාපනය සැපයීම
(5) කුටුම්බ සාමාජිකයන් විසින් රෝගී සහ වියපත් වූවන් රැකබලා ගැනීම

**21.** ප්‍රාථමික ආදායමෙහි ප්‍රධාන සංරචක වනුයේ,

(1) සේවක ගෙවීම්, දළ මෙහෙයුම් අතිරික්තය සහ නිෂ්පාදනය සහ ආනයන මත ශුද්ධ බදු ය.
(2) සේවක ගෙවීම්, මෙහෙයුම් අතිරික්තය සහ නිෂ්පාදනය මත වෙනත් ශුද්ධ බදු ය.
(3) සේවක ගෙවීම්, දළ මෙහෙයුම් අතිරික්තය සහ මිශ්‍ර ආදායම් ය.
(4) සේවක ගෙවීම්, මෙහෙයුම් අතිරික්තය සහ ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය ය.
(5) සේවක ගෙවීම්, දළ මෙහෙයුම් අතිරික්තය සහ නිෂ්පාදනය මත වෙනත් ශුද්ධ බදු ය.



Visit EDUHUB

**22.** කිසියම් වර්ෂයක පෞද්ගලික ආදායම, ජාතික ආදායම ඉක්මවූයේ නම් එමගින් නිගමනය කළ හැක්කේ,

(1) සංක්‍රාම ගෙවීම්වල ප්‍රමාණය, සමාජ ආරක්ෂණ දායක මුදල්, සමාගමික ආදායම් බදු සහ නොබෙදූ සමාගමික ලාභවල මුළු එකතුව ඉක්මවා ඇති බව ය.


(2) සමාජ ආරක්ෂණ දායක මුදල්, සමාගමික ආදායම් බදු සහ නොබෙදූ සමාගමික ලාභවල මුළු එකතුව, සංක්‍රාම ගෙවීම් ඉක්මවා ඇති බව ය.

(3) සමාජ ආරක්ෂණ දායක මුදල් සහ සමාගමික ආදායම් බදුවල එකතුව වක්‍ර බදු ඉක්මවා ඇති බව ය.

(4) සමාජ ආරක්ෂණ දායක මුදල්, සමාගමික ආදායම් බදු සහ වක්‍ර බදුවල එකතුව සංක්‍රාම ගෙවීම්වල ප්‍රමාණය ඉක්මවා ඇති බව ය.

(5) සමාගමික ආදායම් බදු සහ වක්‍ර බදුවල එකතුව සංක්‍රාම ගෙවීම් සහ නොබෙදූ ලාභවල එකතුව ඉක්මවා ඇති බව ය.

**23.** එක්තරා කල්පිත ආර්ථිකයක සමාහාර වියදම් (E) ශ්‍රිතය පහත රූපසටහන මගින් පෙන්නුම් කෙරේ.




මූර්ත නිමැවුම් මට්ටම රුපියල් බිලියන 600 දී

(1) සැලසුම් නොකළ තොග සමුච්චය රුපියල් බිලියන 200 කි.

(2) සැලසුම් නොකළ තොග පහළ වැටීම රුපියල් බිලියන 200 කි.

(3) සැලසුම් නොකළ තොග සමුච්චය රුපියල් බිලියන 150 කි.

(4) සැලසුම් නොකළ තොග පහළ වැටීම රුපියල් බිලියන 150 කි.

(5) ආර්ථිකයේ සාර්ව ආර්ථික සමතුලිතයක් පවතී.

**24.** ධන නිමැවුම් පරතරයක් පවත්නා ආර්ථිකයක

(1) උපයෝජනය නොකළ නිෂ්පාදන ධාරිතාවක් පවතී.

(2) චක්‍රීය සේවා විශුක්තියක් පවතී.

(3) සැබෑ නිමැවුම විභව නිමැවුමට වඩා අඩු ය.

(4) ආර්ථික කටයුතුවල වේගයෙහි පසුබැසීමක් දක්නට ඇත.

(5) ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනීය පීඩන දක්නට ලැබේ.

**25.** ආර්ථිකයක සමාහාර ඉතුරුම් ශ්‍රිතය $S = -200 + 0.25Y$ වේ නම්, මෙම ආර්ථිකයේ සමාහාර පරිභෝජන ශ්‍රිතය වනුයේ,

(1) $C = -200 + 0.75Y$
(2) $C = 200 - 0.25Y$
(3) $C = 200 + 0.25Y$
(4) $C = -200 - 0.75Y$
(5) $C = 200 + 0.75Y$

**26.** කල්පිත ආර්ථිකයක මූර්ත දළ දේශීය නිෂ්පාදිතය රුපියල් ට්‍රිලියන 80ක් ද, නාමික දළ දේශීය නිෂ්පාදිතය රුපියල් ට්‍රිලියන 240ක් සහ පොදු මිල මට්ටම 3ක් ද වේ යයි සලකන්න. මෙම ආර්ථිකයේ මුදල් සැපයුම රුපියල් ට්‍රිලියන 30ක් වේ නම්, මුදලේ සංසරණ ප්‍රවේගය

(1) 8 කි. (2) 10 කි. (3) 30 කි. (4) 80 කි. (5) 90 කි.

**27.** බැංකු පද්ධතිය තුළ එක් වාණිජ බැංකුවක් සතුව රුපියල් මිලියන 400ක අධි සංචිත පවතින බවත්, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 20%ක් බවත් උපකල්පනය කරමු. ඒ අතර, එම බැංකුවෙහි එක්තරා ගනුදෙනුකරුවෙක් රුපියල් මිලියන 25ක් සාම ජංගම ගිණුමෙහි තැන්පත් කරන අතර බැංකුව තවත් ගනුදෙනුකරුවකුට රුපියල් මිලියන 120ක ණය මුදලක් ද ලබා දෙයි. දැන් මෙම බැංකුවට කොපමණ ප්‍රමාණයක් අතිරේක ණය ලබාදිය හැකි ද?

(1) රුපියල් මිලියන 2 125
(2) රුපියල් මිලියන 2 005
(3) රුපියල් මිලියන 425
(4) රුපියල් මිලියන 305
(5) රුපියල් මිලියන 300



Visit EDUHUB

**28.** වර්තමානයේ මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණු කවරේ ද?
(1) මිල ස්ථායිතාව සහ මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව
(2) මිල ස්ථායිතාව සහ පූර්ණසේවා නියුක්තිය
(3) මිල ස්ථායිතාව සහ තිරසාර සංවර්ධනය
(4) පූර්ණසේවා නියුක්තිය සහ ආදායම් ව්‍යාප්තියේ වඩා සමානතාවක් ඇතිකර ගැනීම
(5) මිල ස්ථායිතාව සහ රාජ්‍ය ණය බර අඩුකර ගැනීම

**29.** ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව 10%ක් බවත් මහ බැංකුව වාණිජ බැංකු වෙතින් රුපියල් මිලියන 300ක විවට වෙළෙඳපොළ මිල දී ගැනීම් සිදුකරන බවත් සලකන්න. මෙම මිල දී ගැනීම නිසා මුදල් සැපයුමෙහි සිදුවිය හැකි උපරිම වෙනස්වීම කොපමණ වේ ද?
(1) රුපියල් මිලියන 300කින් වැඩිවීම　　(2) රුපියල් මිලියන 300කින් අඩුවීම
(3) රුපියල් මිලියන 3 000කින් වැඩිවීම　　(4) රුපියල් මිලියන 3 000කින් අඩුවීම
(5) රුපියල් මිලියන 2 700කින් අඩුවීම

**30.** මූල්‍ය ප්‍රතිපත්තිය සමාහාර ඉල්ලුමට බලපානුයේ
(1) සෘජු සහ වක්‍ර බදු ආදායම් ලැබීම් වෙනස් කිරීම මගිනි.
(2) කොටස් මිල ගණන්වල වෙනස් කිරීම මගිනි.
(3) අපනයන ඉල්ලුමෙහි වෙනස් කිරීම මගිනි.
(4) පරිභෝජන හා ආයෝජන වියදම් වෙනස් කිරීම මගිනි.
(5) ආණ්ඩුවේ වියදම් වෙනස් කිරීම මගිනි.

**31.** නිදහස් වෙළෙඳපොළක් තුළ බාහිරතාවක් පවතින විට,
(1) සමතුලිත මිල කෘත්‍රිම වශයෙන් ඉහළ මට්ටමක තීරණය වේ.
(2) සමතුලිත මිල කෘත්‍රිම වශයෙන් පහළ මට්ටමක තීරණය වේ.
(3) වෙළෙඳපොළට සමතුලිතය කරා ළඟාවීමට නොහැකි වේ.
(4) වෙළෙඳපොළ සමතුලිතය සමාජයීය වශයෙන් ප්‍රශස්ත සම්පත් බෙදීයාමක් තහවුරු නොකරයි.
(5) එම භාණ්ඩය පරිභෝජනය කරන පාරිභෝගිකයෝ නඩත්තු සහ රක්ෂණ සඳහා අතිරේක පිරිවැයක් දරති.

**32.** පොදු භාණ්ඩ නිෂ්පාදනය කිරීමට වෙළෙඳපොළ අසමත් වන්නේ,
(1) එබඳු භාණ්ඩ සඳහා ඉල්ලුමක් නොමැති බැවිනි.
(2) එබඳු භාණ්ඩයක් පරිභෝජනය කරන පාරිභෝගිකයන්ගෙන් මිලක් අයකර ගැනීමට නිෂ්පාදකයාට නොහැකි වන බැවිනි.
(3) සාමාන්‍යයෙන් එබඳු භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ දී විශාල බාහිර පිරිවැයක් හටගන්නා බැවින් සහ පාරිභෝජනයේ දී බාහිර ප්‍රතිලාභ ජනනය කරන බැවිනි.
(4) එබඳු භාණ්ඩ නිෂ්පාදනය ආදායම් අසමානතා වැඩිවීමට හේතුවන බැවිනි.
(5) සාමාන්‍යයෙන් රාජ්‍ය අංශයට වඩා පෞද්ගලික ආයතනවල නිෂ්පාදන පිරිවැය අධික බැවිනි.

**33.** ශ්‍රී ලංකා රජයේ පුනරාවර්තන වියදමෙහි ප්‍රධාන සංරචක වනුයේ
(1) පොලී ගෙවීම්, මූර්ත වත්කම් අත්කර ගැනීම, වැටුප් හා වේතන සහ කුටුම්බ සඳහා පැවරුම් ය.
(2) පොලී ගෙවීම්, වැටුප් හා වේතන, රාජ්‍ය සංස්ථා සඳහා ප්‍රාග්ධන පැවරුම් සහ විශ්‍රාම වැටුප් ගෙවීම් ය.
(3) පොලී ගෙවීම්, වැටුප් හා වේතන, කුටුම්බ සඳහා වර්තන පැවරුම් සහ රාජ්‍ය සංස්ථා සඳහා වර්තන පැවරුම් ය.
(4) පොලී ගෙවීම්, වැටුප් හා වේතන, ණය ආපසු ගෙවීම් සහ කුටුම්බ සඳහා වර්තන පැවරුම් ය.
(5) පොලී ගෙවීම්, වැටුප් හා වේතන, මූල්‍ය වත්කම් අත්කර ගැනීම සහ පොහොර සහනාධාරය ය.

**34.** ප්‍රතික්‍රමික ආදායම් බද්දක් යටතේ දිළිඳු ජන කොටස්,
(1) ධනවත් අයට වඩා තම ආදායමෙන් අඩු ප්‍රතිශතයක් බදු වශයෙන් ගෙවති.
(2) ධනවත් අයට වඩා විශාල රුපියල් ප්‍රමාණයක් බදු වශයෙන් ගෙවති.
(3) තම ආදායමෙන් සමානුපාතිකව වෙනස්වන ප්‍රමාණයක් බදු වශයෙන් ගෙවති.
(4) ධනවත් අයට වඩා තම ආදායමෙන් ඉහළ ප්‍රතිශතයක් බදු වශයෙන් ගෙවති.
(5) බදු අයභාරය යොදා ගනිමින් අත්‍යවශ්‍ය භාණ්ඩ මිලයට ගැනීමට සමත්වෙති.

**35.** වර්තමානයේ ශ්‍රී ලංකා මධ්‍යම රජයේ ප්‍රධානතම අයභාර මූලාශ්‍රය වනුයේ
(1) ආදායම් බදු ය.　　(2) නිෂ්පාදනය හා වියදම මත බදු ය.
(3) ලාභ, ලාභාංශ හා පොලී ආදායම් ය.　　(4) වෙළෙඳ ව්‍යවසායන්ගේ දළ ඉපැයීම් ය.
(5) ලොතරැයි අයභාරයයි.



Visit EDUHUB

**36.** සාපේක්ෂ වාසි මූලධර්මයට අනුව ලෝක නිෂ්පාදන සහ පරිභෝජන මට්ටම් ඉහළම අගයක් ගනුයේ, පහත සඳහන් කවර කරුණක් සැබෑවන ලෙස රටවල් විසින් භාණ්ඩ නිෂ්පාදනය කරනු ලබන විට දී ද?

(1) ආවස්ථික පිරිවැය පහළම අගයක් ගනු ලබන විට
(2) නිරපේක්ෂ වාසි ඉහළම අගයක් ගනු ලබන විට
(3) වෙළෙඳ ශේෂය අතිරික්තයක් පෙන්නුම් කරන විට
(4) විනිමය අනුපාතිකය පහළ බසිමින් පවතින විට
(5) ප්‍රවාහන පිරිවැය බොහෝ සෙයින් ශූන්‍ය අගයකට ආසන්න වන විට

**37.** A රටෙහි රෙදි ඒකකයක් නිපදවීමට ශ්‍රම පැය 5ක් ද සහල් ඒකකයක් නිපදවීමට ශ්‍රම පැය 10ක් ද වැය වේ. B රටෙහි රෙදි ඒකකයක් නිපදවීමට ශ්‍රම පැය 7ක් ද සහල් ඒකකයක් නිපදවීමට ශ්‍රම පැය 21ක් ද වැය වේ. එක් එක් රටෙහි සාපේක්ෂ වාසි පදනම්කර ගනිමින් විශේෂ ප්‍රාගුණ්‍යනය කිරීමට දෙරටම තීරණය කරනු ලැබුහොත්, A රට B රට සමග භාණ්ඩ හුවමාරු කිරීමට කැමති වනුයේ කවර හුවමාරු අනුපාතිකයක් යටතේ ද?

(1) සහල් ඒකකයක් සඳහා රෙදි ඒකක 2කට වඩා වැඩි ප්‍රමාණයක්
(2) රෙදි ඒකකයක් සඳහා සහල් ඒකක 2කට වඩා වැඩි ප්‍රමාණයක්
(3) සහල් ඒකකයක් සඳහා රෙදි ඒකක 3කට වඩා වැඩි ප්‍රමාණයක්
(4) රෙදි ඒකකයක් සඳහා සහල් ඒකක 3කට වඩා වැඩි ප්‍රමාණයක්
(5) රෙදි ඒකකයක් සඳහා සහල් ඒකක 0.5කට වඩා වැඩි ප්‍රමාණයක්

**38.** ආරක්ෂණවාදය සාධාරණය කරනු පිණිස බොහෝදුරට යොදා ගැනීමට හැකියාවක් ඇත්තේ පහත දැක්වෙන කවර තර්ක **දෙකක්** ද?

A - ඉහළ පිරිවැය සහිත දේශීය කර්මාන්ත රැකගැනීම
B - උපායමාර්ගික වැදගත්කමක් ඇති කර්මාන්ත රැකගැනීම
C - ළදරු කර්මාන්ත රැකගැනීම
D - පාරිසරික ප්‍රමිතීන් ආරක්ෂාකර ගැනීම
E - රජයේ අයභාරය උපරිමකර ගැනීම

(1) A සහ D (2) B සහ C (3) B සහ D (4) C සහ D (5) D සහ E

**39.** විදේශීය සෘජු ආයෝජන ලැබීමක් වාර්තා කෙරෙනුයේ ගෙවුම් ශේෂයේ කවර ගිණුමක ද?

(1) ප්‍රාථමික ආදායම් ගිණුම (2) ද්විතීයික ආදායම් ගිණුම (3) ප්‍රාග්ධන ගිණුම
(4) ජංගම ගිණුම (5) මූල්‍ය ගිණුම

**40.** පාවෙන විනිමය අනුපාතික යන්නෙන් අදහස් කෙරෙනුයේ,

(1) කම්පනයන් මගින් විදේශ විනිමය වෙළෙඳපොළ තුළ ඇතිවන අස්ථායිතාවන් යළි හැඩගැස්වීමට අසමත් විනිමය අනුපාතිකයන් ය.
(2) විනිමය වෙළෙඳපොළට මැදිහත්වීම් ඔස්සේ රජය විසින් පවත්වාගෙන යනු ලබන විනිමය අනුපාතිකයන් ය.
(3) කිසියම් රටක ව්‍යවහාර මුදල් සඳහා ඇති ඉල්ලුම හා සැපයුම මත තීරණය වන විනිමය අනුපාතිකයන් ය.
(4) රටක ව්‍යවහාර මුදල සඳහා අධි ඉල්ලුමක් ඇති විටක, එම මුදල් ඒකකය අවප්‍රමාණය කිරීමට සිදුවන තත්ත්වයකි.
(5) රටක ව්‍යවහාර මුදල්වල අධි සැපයුම් තත්ත්වයක් ඇති විටක, එම මුදල් ඒකකයේ අගය ඉහළ යාමට තුඩුදෙන තත්ත්වයකි.


**41.** ගෙවුම් ශේෂ සහ විදේශ විනිමය සංචිත පිළිබඳ ප්‍රශ්නවලට මුහුණ පා සිටින රටවලට උදව් කිරීම සඳහා පිහිටුවා ගනු ලැබූ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) ඒ සඳහා යෝජනා කරන ලද විසඳුම වූයේ,

(1) එම රටේ ව්‍යවහාර මුදල ප්‍රතිප්‍රමාණය කිරීම ය.
(2) ප්‍රතිමිලදී ගැනීම් සහ ප්‍රතිවිකුණුම් ගිවිසුම් ඔස්සේ එම රටට විදේශ විනිමය සංචිත ණයට ලබා දීම ය.
(3) එම රටේ විනිමය අනුපාතිකය ඉහළ අගයක නැවත පිහිටුවා ගැනීම සඳහා උදව් කිරීම ය.
(4) එම රට සතු විදේශීය වත්කම් මිල දී ගෙන ඒවා විදේශ ව්‍යවහාර මුදල්වලට පරිවර්තනය කොට දීම ය.
(5) එම රටෙහි අපනයන සඳහා අලුත් වෙළෙඳපොළවල් සොයා ගැනීමට උදව් කිරීම ය.



Visit EDUHUB

**42.** පහත දැක්වෙන රූපසටහන ශ්‍රී ලංකා රුපියලේ අගය එක්සත් ජනපද ඩොලර්වලින් පෙන්නුම් කරයි.




ශ්‍රී ලංකා රුපියල් සඳහා ඉල්ලුම $D_1$ සිට $D_2$ දක්වා විතැන් වුවහොත් ඇතිවිය හැකි ප්‍රතිවිපාකය කවරේ ද?

(1) ඇමෙරිකා එක්සත් ජනපදයට යවනු ලබන ශ්‍රී ලංකා අපනයනවල මිල වඩාත් අධික වනු ඇත.
(2) ශ්‍රී ලාංකික සංචාරකයනට ඇමෙරිකා එක්සත් ජනපදයේ සංචාරය කිරීම ලාභදායක වනු ඇත.
(3) ඇමෙරිකානු ආයෝජකයනට ශ්‍රී ලංකාවේ භාණ්ඩාගාර පිළිනපත් වඩාත් ලාභදායක වනු ඇත.
(4) ඇමෙරිකානු ආයෝජකයනට ශ්‍රී ලංකාවේ භාණ්ඩාගාර පිළිනපත් වඩා මිල අධික වනු ඇත.
(5) ඇමෙරිකා එක්සත් ජනපදයෙන් ගෙන්වනු ලබන ආනයනවල පිරිවැය පහළ වැටෙනු ඇත.

**43.** ආර්ථික සංවර්ධනය යන්නෙන් අදහස් වනුයේ

(1) ගෙවුම් ශේෂ අතිරික්තයක් සහිතව ආර්ථික වෘද්ධියක් හටගැනීම ය.
(2) ආර්ථික වෘද්ධියත් සමගම ව්‍යුහාත්මක සහ ගුණාත්මක වෙනස්කම් සිදුවීම ය.
(3) නාගරික ජනගහනයේ ජීවන තත්ත්වය උසස් වීම ය.
(4) දළ ජාතික ආදායමේ (GNI) තිරසාර ඉහළ යාමක් ඇති වීම ය.
(5) සාධාරණ ආදායම් ව්‍යාප්තියක් සමගම දරිද්‍රතා මට්ටම පහළ වැටීම ය.

**44.** තිරසාර සංවර්ධනයක් යන්නෙන් හැඟැවෙනුයේ

(1) එහි ප්‍රතිඵල වශයෙන් අනාගතයේ පාරිසරික හායනයක් ඇතිවුවත්, වර්තමානයේ ආර්ථික හා සමාජයීය ශක්‍යතාව ලබාදෙන සංවර්ධනයකි.
(2) එහි ප්‍රතිඵලයක් වශයෙන් අනාගත පරම්පරාවන් සඳහා ආර්ථික හා සමාජයීය හායනයක් ඇතිවුවත්, වර්තමානයේ පාරිසරික තිරසාරභාවය ලබාදෙන සංවර්ධනයකි.
(3) අනාගත පරම්පරාවන්ට තම අවශ්‍යතා සපුරාගැනීමට ඇති හැකියාව කැප නොකොට, වර්තමාන අවශ්‍යතා සපුරාලනු ලබන සංවර්ධනයකි.
(4) මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ තිරසාර වැඩිවීමක් සහිතව ස්වභාවික සම්පත් සම්පූර්ණයෙන්ම උපයෝජනය කිරීමකි.
(5) එමගින් වර්තමාන සමාජයේ අවශ්‍යතා සපුරාගත නොහැකි වුවද අනාගත පරම්පරාවනට තම අවශ්‍යතා සපුරාගත හැකි වන සංවර්ධනයකි.

**45.** 'නිරපේක්ෂ' දරිද්‍රතා රේඛාව මගින් පෙන්නුම් කරනුයේ

(1) සමාජයේ දක්නට ලැබෙන අන්ත දරිද්‍රතා මට්ටම ය.
(2) ජීවිතය පවත්වාගෙන යාමට අවශ්‍යවෙතැයි ඇස්තමේන්තු කළ අවම ආදායම් මට්ටම ය.
(3) ඔවුනොවුන්ගේ සංස්කෘතික ප්‍රතිමාන හා සාරධර්මවලට සාපේක්ෂව දිළින්දන් ලෙස ගැනෙන පවුල් ඒකක ප්‍රමාණයයි.
(4) නගරයක් තුළ දිළිඳු ජනතාව සංකේන්ද්‍රණය වී සිටින ප්‍රදේශයන් ය.
(5) ජනගහනයෙන් පහළම ආදායම උපයන 10% හිමිකරගත් සාමාන්‍ය මාසික ආදායම ය.

**46.** පහත සඳහන් කවරක් මැනීමට ලෝරන්ස් වක්‍රය යොදා ගැනේ ද?

(1) විවිධ රටවල ධනය සහ ආදායම අතර අනුපාතය
(2) විවිධ රටවල පොදු භාණ්ඩ සහ පෞද්ගලික භාණ්ඩ අතර අනුපාතය
(3) විවිධ රටවල ආදායම් සමානතාව සහ ආදායම් අසමානතාව අතර අනුපාතය
(4) කිසියම් රටක ඉහළම ආදායම් ලබන ප්‍රතිශතය සහ පහළම ආදායම ලබන ප්‍රතිශතය අතර අනුපාතය
(5) වැඩකරන වයසේ ජනගහනය සහ වැඩ නොකරන වයසේ ජනගහනය අතර අනුපාතය



Visit EDUHUB

**47.** කම්කරුවකුගේ ආන්තික ඵලදාව ශුන්‍යය හෝ ශුන්‍යයට ආසන්නව හෝ පවතිනුයේ කවර විරැකියා තත්ත්වයක් යටතේ ද?

(1) සැඟවුණු සේවා වියුක්තිය
(2) අනිච්ඡානුගත සේවා වියුක්තිය
(3) වාරික සේවා වියුක්තිය
(4) ව්‍යුහාත්මක සේවා වියුක්තිය
(5) සාර්ගික සේවා වියුක්තිය

**48.** ලෝක බැංකුවේ 'ව්‍යාපාර කරගෙන යාමේ පහසුව' පිළිබඳ දර්ශක (Ease of Doing Business Indicators)

(1) සත්කාරක රටවල් වශයෙන් ලබාගත් විදේශ සෘජු ආයෝජන ප්‍රමාණ මත රටවල් පෙළගස්වයි.
(2) ආයෝජන ප්‍රභවස්ථාන රටවල් වශයෙන් තමන් ආයෝජනය කොට ඇති විදේශ සෘජු ආයෝජන මත රටවල් පෙළගස්වයි.
(3) ඒ ඒ රටවල් සතු සාපේක්ෂ වාසි මත කර්මාන්ත පෙළගස්වයි.
(4) බොහෝ රටවල ව්‍යාපාරයක් ආරම්භ කිරීමට සහ පවත්වාගෙන යාමට ඇති පහසුව මිනුම් කරයි.
(5) දිළිඳු රටවල ආයෝජනය කිරීම අධෛර්යමත් කෙරෙන බැවින් ආර්ථික සංවර්ධනයට බාධකයක් වේ.

**49.** 2018 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය නිවැරදිව දැක්වෙනුයේ කුමන කාණ්ඩය මගින් ද?

| | කෘෂිකර්මය, වනාන්තර සහ ධීවර | කර්මාන්ත | සේවා |
|---|---|---|---|
| (1) | 7.0 | 26.1 | 57.7 |
| (2) | 7.6 | 25.8 | 60.4 |
| (3) | 8.2 | 24.0 | 60.1 |
| (4) | 8.9 | 27.8 | 64.4 |
| (5) | 10.2 | 24.5 | 60.2 |

**50.** 2018 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ විදේශීය සෘජු ආයෝජන සඳහා ඉතාම ඉහළ දායකත්වය සැපයූ රටවල් හතර වූයේ

(1) චීනය, හොංකොං, ඉන්දියාව සහ මැලේසියාවයි.
(2) චීනය, සිංගප්පූරුව, ජපානය සහ ස්විට්සර්ලන්තයයි.
(3) චීනය, ඉන්දියාව, ජපානය සහ නෝර්වේ ය.
(4) චීනය, කැනඩාව, ඉතාලිය සහ ඇමෙරිකා එක්සත් ජනපදයයි.
(5) චීනය, ඉන්දියාව, මැලේසියාව සහ ජර්මනියයි.

***



Visit EDUHUB

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2020

නව නිර්දේශය/ புதிய பாடத்திட்டம

විෂය අංකය / பாட இலக்கம்: **21**

විෂයය / பாடம்: **ආර්ථික විද්‍යාව**

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

### I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 2 | 11. | 4 | 21. | 1 | 31. | 4 | 41. | 2 |
| 02. | 1 | 12. | 1 | 22. | 1 | 32. | 2 | 42. | 3 |
| 03. | 4 | 13. | 5 | 23. | 3 | 33. | 3 | 43. | 2 |
| 04. | 2 | 14. | 1 | 24. | 5 | 34. | 4 | 44. | 3 |
| 05. | 2 | 15. | 1 | 25. | 5 | 35. | 2 | 45. | 2 |
| 06. | 1 | 16. | 2 | 26. | 1 | 36. | 1 | 46. | 3 |
| 07. | 1 | 17. | 2 | 27. | 5 | 37. | 1 | 47. | 1 |
| 08. | 2 | 18. | 4 | 28. | 1 | 38. | 2 | 48. | 4 |
| 09. | 2 | 19. | 2 | 29. | 3 | 39. | 5 | 49. | 1 |
| 10. | 1 | 20. | 5 | 30. | 4 | 40. | 3 | 50. | 1 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 02 ලකුණු බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 2 × 50 = 100



Visit EDUHUB

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව இலங்கைப் பரீட்சைத் திணைக்களம் Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

ආර්ථික විද්‍යාව II
பொருளியல் II
Economics II

21 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස් :**

* 'අ' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද, 'ආ' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* ප්‍රස්තාර කඩදාසි සපයනු ලැබේ.

## 'අ' උප කොටස

(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** තෝරා ගන්න.)

### 01 වන ප්‍රශ්නය

**1.** (i) හිඟකම යනුවෙන් අදහස් කරනුයේ කුමක් ද? නිෂ්පාදන හැකියා වක්‍රයක් යොදා ගනිමින් හිඟකම පිළිබඳ ප්‍රශ්නය පැහැදිලි කරන්න. (ලකුණු 03යි)

(ii) නිෂ්පාදන අකාර්යක්ෂමතාව සහ සම්පත් බෙදා වෙන්කිරීමේ අකාර්යක්ෂමතාව, සම්පත් උපයෝජනයේ නාස්තියක් ලෙස සැලකෙන්නේ ඇයි? (ලකුණු 04යි)

(iii) ආර්ථික පද්ධතියක ප්‍රධාන කාර්යයන් කවරේ ද? (ලකුණු 03යි)

(iv) කෝවිඩ් -19 වැනි වසංගත තත්ත්වයක් නිසා රටක නිෂ්පාදන ධාරිතාවට කුමක් සිදුවනු ඇද්දැයි නිෂ්පාදන හැකියා වක්‍රයක් යොදා ගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

(v) ශ්‍රමික විභාජනය ආර්ථිකයක නිෂ්පාදන මට්ටමෙහි ඉහළ යාම් සඳහා හේතුවන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 05යි)


01. (i) - මිනිස් උවමනා හැමවිටම ඒවා සපුරාගැනීම සඳහා පවත්නා සම්පත් ඉක්මවා යන විශ්ව සාධාරණ තත්ත්වය හිඟකම යනුවෙන් අදහස් කෙරේ.
එය අවශ්‍යයෙන්ම අසීමිත වුවමනා සහ සීමිත සම්පත් ආශ්‍රයෙන් පැන නගින ප්‍රශ්නයකි. (ලකුණු 01 යි)

- නිෂ්පාදන හැකියා වක්‍රයක් ආශ්‍රයෙන් හිඟකම පැහැදිලි කළ හැකිය. නිෂ්පාදන හැකියා වක්‍රයකින් පෙන්නුම් කරනුයේ යම් දෙන ලද අවස්ථාවක ආර්ථිකයේ සියලුම සම්පත් පූර්ණ සහ කාර්යක්ෂම ලෙස උපයෝජනය කරනු ලැබුවහොත් අත්කර ගත හැකි සියලු භාණ්ඩ සංයෝගයන්ය.
නිෂ්පාදන හැකියා වක්‍රයක් මගින් අත්කර ගත හැකි භාණ්ඩ සංයෝග (උදා :- B, C) අත් කරගත නොහැකි භාණ්ඩ සංයෝග වලින් (උදා :- A) වෙන්කොට දක්වේ.



Visit EDUHUB

හිඟකම යනුවෙන් අදහස් කරනුයේ මිනිස් වුවමනා පිළිබිඹුකරන භාණ්ඩ සංයෝග අත්කර ගත හැකි භාණ්ඩ සංයෝග ඉක්මවා යන තත්ත්වයක් බැවින් නිෂ්පාදන හැකියා වක්‍රයකට පිටතින් පිහිටි ලක්ෂ්‍යයන් හිඟකම පෙන්නුම් කරයි. (ලකුණු 01 යි)




(නිවැරදි රූප සටහනට ලකුණු 01 යි)

(ii) - නිෂ්පාදන ආයතනයක් අඩුම පිරිවැයකින් භාණ්ඩයක් නිෂ්පාදනය නොකරන විට නිෂ්පාදන අකාර්යක්ෂමතාව හටගනී. එහිදී ආයතනය යෙදවුම් ඒකකයකින් උපරිම නිමැවුම් ප්‍රමාණය ලබා ගැනීමට හෝ නිමැවුම් ඒකකයක් අවම යෙදවුම් ප්‍රමාණයකින් නිපදවා ගැනීමට හෝ අසමත් වේ. (ලකුණු 01 යි)

- ආර්ථිකය සමස්තයක් වශයෙන් ගත් විටදී මින් අදහස් වන්නේ යම් දෙන ලද සම්පත් ප්‍රමාණයකින් උපරිම නිමැවුම් ප්‍රමාණය ලබා ගැනීමට ආර්ථිකය අසමත් වන බවය. එවැනි ආර්ථිකයකට පූර්ණසේවා නියුක්තිය සහ පූර්ණ නිෂ්පාදනය සහිතව නිෂ්පාදන හැකියා වක්‍රය මත රැඳී සිටීමට නොහැකි වේ.
නිෂ්පාදන හැකියා වක්‍රයෙන් ඇතුළත ලක්ෂ්‍යයක කටයුතු කිරීමට ආර්ථිකයට සිදුවන අතර එහි ප්‍රතිඵල වශයෙන් සම්පත් ඌන උපයෝජනයක් හා විරැකියා තත්ත්වයක් පැන නගී. (ලකුණු 01 යි)

- සමාජය වඩ වඩාත් ඉල්ලුම් කරනු ලබන භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම සඳහා සම්පත් බෙදා වෙන් කිරීමට ආර්ථිකය අසමත් වන විට සම්පත් බෙදා වෙන්කිරීමේ අකාර්යක්ෂමතාව හටගනී. (ලකුණු 01 යි)

- කිසියම් භාණ්ඩයක් සඳහා පාරිභෝගිකයන් විසින් ලබාදෙන වටිනාකම (උදා: භාණ්ඩයක් සඳහා ගෙවීමට සූදානම් සහ ගෙවිය හැකි මිල) හා සමානවූම සම්පත් ප්‍රමාණයක් එම භාණ්ඩය නිෂ්පාදනය කිරීම සඳහා වැය නොකෙරෙන විට එක්කෝ අධි නිෂ්පාදනයක් නැතහොත් ඌන නිෂ්පාදනයක් හටගැනීමෙන් සම්පත් නාස්තියක් ආර්ථිකයේ හටගනී. (ලකුණු 01 යි)

(iii) - සෑම ආර්ථික පද්ධතියක්ම ඒවායේ ස්වභාවය කුමක් වුවද මූලික ප්‍රශ්න තුනක් විසඳා ගැනීම සඳහා ක්‍රියාකළ යුතුවේ. ඒ අනුව ආර්ථික පද්ධතියක ප්‍රධාන කාර්යයන් සමන්විත වනුයේ පහත සඳහන් ප්‍රධාන ප්‍රශ්න තුන විසඳා ගැනීමය.



Visit EDUHUB

- කවර භාණ්ඩ හා සේවා (කොතරම් ප්‍රමාණයක්) නිෂ්පාදනය කළ යුතු ද යන ප්‍රශ්නය විසඳා ගැනීම - (සම්පත් බෙදා වෙන්කිරීමේ කාර්යය)


- එම භාණ්ඩ හා සේවා කෙසේ නිෂ්පාදනය කළ යුතුද (නිෂ්පාදන ක්‍රම ශිල්ප තෝරා ගැනීම) යන ප්‍රශ්නය විසඳා ගැනීම - නිෂ්පාදන කාර්යය

- එම භාණ්ඩ හා සේවා කවුරුන් සඳහා නිෂ්පාදනය කළ යුතුද යන ප්‍රශ්නය විසඳා ගැනීම - බෙදාහැරීමේ කාර්යය **(එක් කාර්යයකට ලකුණු 01 බැගින් ලකුණු 03 යි)**

(iv) - කෝවිඩ් - 19 වැනි වසංගත රෝග තත්ත්වයක් නිසා ආර්ථිකයේ නිෂ්පාදන ධාරිතාවට කුමක් සිදුවේද යන්න රඳා පවතිනුයේ එම වසංගත තත්ත්වය සහ එය පාලනය කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග ආර්ථිකයේ සම්පත් සම්භාරයට සහ ඵලදායිතාවට ඇතිකරනු ලබන බලපෑම මතය. **(ලකුණු 01 යි)**

- එම වසංගතය ශ්‍රම හමුදාවේ ප්‍රමාණය සහ එහි ඵලදායිතාව කෙරෙහි සැලකිය යුතු බලපෑමක් සිදුකෙරේ නම් ආර්ථිකයේ නිෂ්පාදන ධාරිතාව අවශ්‍යයෙන්ම පහළ වැටෙනු ඇත. ආර්ථිකයේ නිෂ්පාදන හැකියා වක්‍රය පහළට විතැන් වනු ඇත. **(ලකුණු 01)**

- විභව නිමැවුම පහළ වැටීම නිසා නිෂ්පාදන හැකියා වක්‍රයට ඇතිවන බලපෑම පහත රූප සටහන පෙන්නුම් කරයි.





**(නිවැරදි රූප සටහනට ලකුණු 01 යි)**

- කෝවිඩ් - 19 වසංගතය රටේ ශ්‍රම හමුදාවට හෝ ඵලදායිතාවට හෝ වැදගත් බලපෑමක් නොකලේ නම් නිෂ්පාදන ධාරිතාවට හා විභව නිමැවුමට හානියක් සිදු නොවේ. එහිදී නිෂ්පාදන හැකියා වක්‍රයේ විතැන්වීමක් සිදු නොවේ. එහෙත් වසංගතය පාලනය කිරීම සඳහා එම රට හා අවශේෂ ලෝකය ගනු ලබන ප්‍රතිචාර (ප්‍රදේශ වසා තැබීම, ගුවන් ගමන් අත්හිටුවීම, සංචරණය සීමා කිරීම, සැපයුම් දාම හා වෙළෙඳපොළ ජාල අවහිර වීම) හේතු කොට නිෂ්පාදන ධාරිතාව උපයෝජනය කිරීමේ හැකියාව සීමා වනු ඇත. එහිදී ධාරිතා ඌන උපයෝජනයක් හටගනී. **(ලකුණු 01 යි)**

- මෙවැනි තත්ත්වයකදී නිෂ්පාදන හැකියා වක්‍රය පහළට විතැන් නොවන අතර ආර්ථිකයේ සැබෑ නිමැවුම් මට්ටම වසංගතයට පෙර තිබුණු මට්ටමට වඩා අඩු අගයක් ගනී. නිෂ්පාදන හැකියා වක්‍ර රූප සටහනක එය පහත දැක්වෙන ආකාරයට පෙන්නුම් කළ හැකිය.



Visit EDUHUB




(නිවැරදි රූප සටහනට ලකුණු 01 යි)

(v) - **ඵලදායිතාව ඉහළ යාම :** වැඩ බෙදාගෙන කිරීම නිසා විශේෂ ප්‍රාගුණ්‍යතය හටගන්නා අතර එය ශ්‍රමිකයන්ගේ ඵලදායිතාව විශාල ලෙස ඉහළ නංවයි. අල්පෙනෙත්ති නිෂ්පාදනය පිළිබඳ ඇඩම්ස් මිත්ගේ උදාහරණය අපට මෙහිදී සිහිපත් වේ. (වැඩ බෙදාගත්විට එක් ශ්‍රමිකයෙක් දිනකට අල්පෙනෙත්ති 4800 ක් නිපදවයි. වැඩ බෙදා ගැනීමක් නොමැති විට එක් ශ්‍රමිකයෙකුට දිනකට නිපදවිය හැක්කේ එක් අල්පෙනෙත්තක් හෝ වැඩිම වුවහොත් අල්පෙනෙත්ති 20 ක් හෝ පමණි.

- **සුදුසු පුද්ගලයා සුදුසු කාර්යයට යොදාගත හැකි වීම :** විවිධ පුද්ගලයන්ගේ නිපුණතා, හැකියා සහ බැඳියාවන් වෙනස් බැවින් තමන්ට වඩාත් ගැළපෙන ක්‍රියාකාරකම් තෝරාගෙන ඒවාට යොමු කිරීමෙන් ශ්‍රම ඵලදායිතාව ඉහළ නගී. කිසියම් සේවකයෙකුට ක්‍රියාකාරකම් සමූහයක් කිරීමට සිදුවුවහොත් ඒ සියලු ක්‍රියාකාරකම් පිළිබඳ එක හා සමාන දක්ෂතාවක් ඔවුනට නොතිබෙන බැවින් එවැන්නන්ගේ ඵලදායිතාවද අඩු ය.

- **පළපුරුද්ද හා කුසලතා වර්ධනය වීම :** එකම කාර්යයෙහි නිරන්තරවම යෙදීම නිසා ශ්‍රමිකයන්ගේ පළපුරුද්ද හා නිපුණතාව වර්ධනය වේ. වඩාත් ඉක්මනින් සහ වඩාත් ගුණාත්මකව භාණ්ඩ නිෂ්පාදනය කිරීමට මෙමගින් ඉඩ සැලසේ.

- **නවෝත්පාදන බිහිවීමට මං සැලසේ :** කිසියම් පුද්ගලයෙකුගේ විශේෂ ප්‍රාගුණ්‍යය නිසා එම කාර්යය ඉටු කිරීමට යෝග්‍ය වඩාත් හොඳ ක්‍රම ශිල්ප ගැන අළුත් අදහස් පැන නැගිය හැකිය. නිෂ්පාදනය කාර්යක්ෂම කළ හැකි නව යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ මේ ආශ්‍රයෙන් බිහිවනු ඇත.

- **කාලය ඉතිරිවීම :** ශ්‍රමික විභජනය යටතේ එක් පුද්ගලයෙක් සම්බන්ධ වනුයේ සමස්ත නිෂ්පාදන ක්‍රියාවලියේ එක් කොටසකට පමණක් වන බැවින් ඔහු පුහුණුව හා නිපුණතාව ලබාගත යුත්තේ එම කටයුත්ත සඳහා පමණි. සමස්ත ක්‍රියාවලිය පිළිබඳ දිගුකාලීන පුහුණුවීම් අවශ්‍ය නොවන බැවින් කාලය හා මුදල් ඉතිරි කරගත හැකිවේ. තවද කිසියම් පුද්ගලයෙකු එකම කාර්යයක පමණක් නියැලී සිටින බැවින් එක් ක්‍රියාවලියක සිට තවත් ක්‍රියාවලියක් කරා මාරුවීමටද අවශ්‍ය නොවේ. ඒ නිසාද කාලය විශාල වශයෙන් ඉතිරි කරගත හැකිවේ.



Visit EDUHUB

- මහා පරිමාණ නිෂ්පාදනය ප්‍රවර්ධනය වීම : ශ්‍රමික විභජනය නිසා නිෂ්පාදන ක්‍රියාවලියට යන්ත්‍ර භාවිතා කිරීමට ඇති ඉඩ කඩ ඉතා විශාලය. නිෂ්පාදන ක්‍රියාවලිය කුඩා ක්‍රියාකාරකම්වලට වෙන්කොට ඇති බැවින් එක් එක් ක්‍රියාකාරකම සඳහා වඩාත් යෝග්‍ය යන්ත්‍ර සූත්‍ර උපකරණ හඳුන්වා දිය හැකිය. යන්ත්‍ර සූත්‍ර වඩාත් ඵලදායි ලෙස උපයෝජනය වීමට නම් විශාල නිමැවුම් මට්ටමක් බිහිකිරීමට අවශ්‍ය කෙරේ. යන්ත්‍ර සූත්‍ර ඌන උපයෝජනය වුවහොත් ආයතනයට ඉහළ නිෂ්පාදන පිරිවැයකට මුහුණ පෑමට සිදුවේ. එබැවින් ශ්‍රමික විභජනය හැමවිටම මහා පරිමාණ නිෂ්පාදනයට අනුබල දේ.

**(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු පහකට ලකුණු 05 යි)**

**02 වන ප්‍රශ්නය**

**2.** (i) භාණ්ඩයක් සඳහා ඇති ඉල්ලුම සහ ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය අතර වෙනස කුමක් ද? රූපසටහනක එම වෙනස පෙන්වා දෙන්න. (ලකුණු 04යි)

(ii) ආදායම් ඉල්ලුම් නම්‍යතා සංකල්පය යොදා ගනිමින් සාමාන්‍ය භාණ්ඩ, බාල භාණ්ඩ සහ සුඛෝපභෝගී භාණ්ඩ නිර්වචනය කරන්න. (ලකුණු 03යි)

(iii) ආර්ථිකයක භාණ්ඩ බෙදාවෙන්කර හැරීම සඳහා යොදා ගනු ලබන මිල නොවන සළාකන ක්‍රම **තුනක්** නම් කරන්න. (ලකුණු 03යි)

(iv) එක්තරා කුඩා නගරයක ඇති පාන් වෙළෙඳපොළක් පහත සඳහන් ඉල්ලුම් හා සැපයුම් සමීකරණ මගින් නිරූපණය කෙරේ.

$Q_D = 110 - P$ (ඉල්ලුම)        $Q_S = -40 + 2P$ (සැපයුම)

(a) මෙම වෙළෙඳපොළෙහි සමතුලිත මිල සහ ප්‍රමාණය සොයන්න. (ලකුණු 02යි)

(b) සමතුලිතයේ දී සමස්ත අතිරික්තයේ ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 04යි)

(c) රුපියල් 60 දී පාන් ඉල්ලුමෙහි මිල නම්‍යතාව ගණනය කරන්න. (ලකුණු 04යි)

02. (i) - ඉල්ලුම යනුවෙන් අදහස් කරනුයේ යම් දෙන ලද කාල පරිච්ඡේදයකදී අනිකුත් කරුණු නොවෙනස්ව තිබියදී කිසියම් භාණ්ඩයක් සඳහා පැවැතිය හැකි විකල්ප මිලයන්හිදී පාරිභෝගිකයන් විසින් මිලදී ගැනීමට කැමැති සහ මිලදී ගැනීමට හැකියාව ඇති භාණ්ඩ ප්‍රමාණයන්ය.


- වඩා සැකෙවින් දක්වනවානම් ඉන් අදහස් වන්නේ යම් දෙන ලද කාල පරිච්ඡේදයක් තුළ අනිකුත් කරුණු නොවෙනස්ව තිබියදී කිසියම් භාණ්ඩයක් සඳහා පැවැතිය හැකි විකල්ප මිලයන් යටතේ පාරිභෝගිකයන් විසින් ඉල්ලුම් කරනු ලබන භාණ්ඩ ප්‍රමාණයන්ය. **(ලකුණු 01 යි)**

- ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය යන්නෙන් අදහස් කරනුයේ යම් දෙන ලද අවස්ථාවක අනිකුත් කරනු නොවෙනස්ව තිබියදී පාරිභෝගිකයන් විසින් කිසියම් මිලකදී යම්කිසි භාණ්ඩයක් හෝ සේවාවක් ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණයයි. **(ලකුණු 01 යි)**

- රූප සටහනක් මගින් පහත දක්වෙන ආකාරයට මෙම වෙනස පෙන්නුම් කළ හැකිය. ඉල්ලුම, ඉල්ලුම් වක්‍රයක් මගින් පෙන්නුම් කළ හැකි අතර ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය, ඉල්ලුම් වක්‍රයේ කිසියම් ලක්ෂ්‍යයක් මගින් දක්විය හැකිය.



Visit EDUHUB




(ඉල්ලුම නිවැරදිව පෙන්නුම් කිරීමට ලකුණු 01 යි, ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය නිවැරදිව පෙන්නුම් කිරීමට ලකුණු 01 යි, මුළු ලකුණු 02 යි.)

(ii) - ආදායම් ඉල්ලුම් නම්‍යතා සංගුණකය ධන අගයක් ගනු ලබන භාණ්ඩ හා සේවා සාමාන්‍ය භාණ්ඩ වශයෙන් හඳුන්වනු ලැබේ. (ලකුණු 01 යි)

- ආදායම් ඉල්ලුම් නම්‍යතා සංගුණකය ඍණ අගයක් ගනු ලබන භාණ්ඩ හා සේවා බාල භාණ්ඩ වශයෙන් හඳුන්වනු ලැබේ. (ලකුණු 01 යි)

- ආදායම් ඉල්ලුම් නම්‍යතා සංගුණකය 1 ට වඩා වැඩි අගයක් ගනු ලබන භාණ්ඩ හා සේවා සුඛෝපභෝගී භාණ්ඩ වශයෙන් හඳුන්වනු ලැබේ. (ලකුණු 01 යි)

(iii) මිල නොවන සළාකන ක්‍රම :

- **පෝලිම් ක්‍රමය** : භාණ්ඩ අවශ්‍ය කරන අය පෝලිමේ බලා සිටිය යුතු අතර ඔවුන් පෝලිමේ පැමිණෙන අනුපිළිවෙළ අනුව භාණ්ඩ ලබා දෙනු ලැබේ.

- **කූපන් ක්‍රමය** : මෙහිදී රජය පාරිභෝගිකයන් හා නිෂ්පාදකයන් වෙත කූපන් පත් නිකුත් කරනු ලබන අතර මුදල් සමග කූපන් පත් ඉදිරිපත් කරනු ලබන අයට පමණක් භාණ්ඩ ලබා දෙනු ලැබේ.

- **කුසපත් ඇදීමේ ක්‍රමයක් ඔස්සේ ටිකට්පත් ලබා දීම** : ටිකට් පත් හිමියන්ට පමණක් භාණ්ඩ හා සේවා ලබා දෙනු ලැබේ.

- **හිතවත්කම්** : හිතවත් ගනුදෙනුකරුවන්ට පමණක් භාණ්ඩ ලබාදීම.

- **කළුකඩ ඔස්සේ භාණ්ඩ ලබාදීම** : උපරිම මිල සීමා නීති විරෝධී ලෙස උල්ලංඝනය කරමින් භාණ්ඩ අලෙවි කෙරේ.

- **තවත් භාණ්ඩයක් සමග ඈඳා බෙදා හැරීම (Budling)** : මිල අධික භාණ්ඩයක් සමග අඩුමිල භාණ්ඩයක් ඈඳීම.

(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු තුනකට ලකුණු 03 යි.)



Visit EDUHUB

(iv) (a) සමතුලිත මිල හා ප්‍රමාණය :

- $Q_D = Q_S$

$110 - P = -40 + 2P$

$2P + P = 110 + 40$


$3P = 150$

$P =$ <u>රු. 50</u> (ලකුණු 01 යි)

$Q_D = 110 - P = 110 - 50 = 60$

ප්‍රමාණය ඒකක 60 (ලකුණු 01 යි)

(b) සමතුලිතයේදී සමස්ත අතිරික්තය




- සමස්ත අතිරික්තය = පාරිභෝගික අතිරික්තය + නිෂ්පාදක අතිරික්තය

පාරිභෝගික අතිරික්තය = $\{(110 - 50) \times 60\} \div 2 = 3600/2 = 1800$

(ලකුණු 01 යි)

නිෂ්පාදක අතිරික්තය = $\{(50 - 20) \times 60\} \div 2 = 1800/2 = 900$ (ලකුණු 01 යි)

සමස්ත අතිරික්තය = $1800 + 900 = 2700$ (ලකුණු 01 යි)

(නිවැරදි රූප සටහනට ලකුණු 01 යි මුළු ලකුණු 04 යි)

**විකල්ප ක්‍රමය :**

සමස්ත අතිරික්තය = $\{(110 - 20) \times 60\} \div 2$ (ලකුණු 01 යි)

$= (90 \times 60) \div 2 \}$ $5400/2 = 2700$ (ලකුණු 02 යි)

(නිවැරදි රූප සටහනට ලකුණු 01 යි, නිවැරදි ගණනය කිරීමට ලකුණු 03 යි, මුළු ලකුණු 04 යි)

(c) රුපියල් 60 දී මිල නම්‍යතාව : (ලක්ෂ්‍ය නම්‍යතා සූත්‍රය අදාළ වේ.)

$$\frac{\Delta Q}{\Delta P} \times \frac{P}{Q}$$

- $Q_D = 110 - P$; $P = 60$, නම් $Q = 110 - 60 = 50$

- $\frac{\Delta Q}{\Delta P} = -1$; $\frac{P}{Q} = \frac{60}{50}$ (ලකුණු 02 යි)

- මිල නම්‍යතාව $-1 \times \frac{60}{50} = \frac{-60}{50} = \frac{-6}{5} = -1.2$ (ලකුණු 02 යි)



Visit EDUHUB

| **03 වන ප්‍රශ්නය** | |
|---|---|
| **3.** (i) 'උපරිම මිල' සහ 'අවම මිල' අතර වෙනස දක්වන්න. | (ලකුණු 04යි) |
| (ii) උපරිම මිලක් නිසා කිසියම් භාණ්ඩයක් සඳහා අධි ඉල්ලුමක් ඇති වන්නේ ඇයි? රූපසටහනක් යොදා ගනිමින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. | (ලකුණු 04යි) |
| (iii) නිෂ්පාදක සහනාධාරයක් නිසා ශුභ සාධනය අහිමි වී යාමක් හට ගන්නේ ඇයි? යෝග්‍ය රූපසටහනක් යොදා ගනිමින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. | (ලකුණු 04යි) |
| (iv) තරගකාරී වෙළෙඳපොළක ඉල්ලුම් ශ්‍රිතය, $Q_D = 180 - 2P$ සමීකරණයෙන් ද, සැපයුම් ශ්‍රිතය $Q_S = -15 + P$ සමීකරණයෙන් ද දැක්වේ. මෙම වෙළෙඳපොළෙහි භාණ්ඩ ඒකකයක් රුපියල් 72ක් ලෙස අවම මිලක් නියම කරනු ලැබුවහොත්, එහි ප්‍රතිඵලයක් වශයෙන් අහිමිවන ශුභ සාධනයේ ප්‍රමාණය ගණනය කරන්න. | (ලකුණු 08යි) |

03. (i) - උපරිම මිල සීමාවක් යනුවෙන් අදහස් කරනුයේ කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් සඳහා නියම කරන ලද විශේෂිත මිලට වඩා වැඩි මිලකට එම භාණ්ඩ හෝ සේවාව අලෙවිකිරීම නීති විරෝධී ලෙසට සැලැකෙන නියෝගයකි.

- එය කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් සඳහා අලෙවිකරුවන්ට නීත්‍යානුකූලව අයකළ හැකි උපරිම මිලයි. (ලකුණු 02 යි)


- අවම මිල සීමාවක් යනුවෙන් අදහස් කරනුයේ කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් සඳහා නියම කරන ලද විශේෂිත මිලට වඩා අඩු මිලක් ගෙවීම නීති විරෝධී ලෙසට සැලැකෙන නියෝගයකි.

- එය කිසියම් සාධකයක් හෝ සේවාවක් සඳහා රජය විසින් නියම කරන ලද අවම මිලය. (ලකුණු 02 යි)

(ii) - රජය විසින් ඇතැම් සුවිශේෂී භාණ්ඩ හා සේවා සඳහා උපරිම මිල සීමා පනවනුයේ සමතුලිත මිලේදී මිලදී ගැනීමට හැකියාවක් නොමැති පාරිභෝගිකයාට අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට හැකිවන ලෙසටය.

- සමතුලිත මිලට වඩා පහළින් උපරිම මිල සීමාවන් නියම කරන ලද විට වෙළෙඳපොළෙහි අධි ඉල්ලුම් තත්ත්වයක් පැනනගී. (ඉල්ලුම් වක්‍රය පහළට හා සැපයුම් වක්‍රය ඉහළට බෑවුම් වන විට) (ලකුණු 02 යි)

- පහත දැක්වෙන ආකාරයට රූප සටහනක් මගින් මෙම තත්ත්වය පැහැදිලි කළ හැකිය.






Visit EDUHUB

- රජය විසින් වෙළෙඳපොළ සමතුලිත මිල ($P_1$) ට පහළින් උපරිම මිල $P_M$ වශයෙන් නියම කරනු ලැබුවහොත් සැපයුම්කරුවන් සපයනුයේ $Q_0$ ප්‍රමාණය වන අතර එම මිලේදී පාරිභෝගිකයෝ $Q_2$ ප්‍රමාණය ඉල්ලුම් කරති. මෙහිදී $Q_0$ - $Q_2$ ප්‍රමාණයේ අධි ඉල්ලුමක් වෙළෙඳපොළෙහි හටගනී.

(නිවැරදි රූපසටහනට ලකුණු 02 යි)


(iii) - වෙනත් කවර හෝ මිල පාලන ක්‍රමයක්සේම නිෂ්පාදන සහනාධාරද ශුභ සාධනය අහිමිවීමක් නිර්මාණය කරයි. නිෂ්පාදක හා පාරිභෝගික යන දෙපිරිසම සහනාධාර නිසා වාසි ලැබුවද සමාජය සමස්තයක් වශයෙන් ගත් විට, නිෂ්පාදකයන් සහ පාරිභෝගිකයන් ලබන ප්‍රතිලාභයට වඩා විශාල වූ පිරිවැයක් සහනාධාරය සඳහා සමාජය දරයි.

- තරගකාරී වෙළෙඳපොළකදීට වඩා සහනාධාරයක් සහිත වෙළෙඳපොළ තුළ වැඩි පිරිසක් අදාළ භාණ්ඩය මිලදී ගනිති. මීට හේතුව සහනාධාරය නිසා භාණ්ඩයේ මිල පහළ බැසීමයි. වැඩිපුර මිලදී ගන්නා ප්‍රමාණයට පාරිභෝගිකයන් ලබාදෙන වටිනාකම සැබැවින්ම සහනාධාරය සඳහා රජය දරණ පිරිවැයට වඩා අඩු අගයකි.

- සහනාධාරය සහිත භාණ්ඩ පාරිභෝගිකයනට රජය ලබාදෙන ත්‍යාගයක් හා සමානය. එයට පාරිභෝගිකයන් දෙන වටිනාකම (පාරිභෝගික අතිරික්තය) ත්‍යාගය මිලදී ගැනීමට රජය වැයකරන පිරිවැය (රජයේ අයභාර පිරිවැය) ට වඩා අඩුය.

(ලකුණු 02 යි)

- පහත සඳහන් රූප සටහන මගින් අහිමිවන සුභ සාධනය පෙන්නුම් කළ හැකිය.




සහනාධාරයෙන් පසු පාරිභෝගික අතිරික්තය වැඩිවීම = $C+D+E$

සහනාධාරයට පසු නිෂ්පාදක අතිරික්තයේ වැඩිවීම = $A+B$

සහනාධාරයට පසු ආර්ථික අතිරික්තයේ වැඩිවීම = $A+B+C+D+E$

සහනාධාරය සඳහා රජයේ පිරිවැය = $A+B+C+D+E+F+G$

ශුභසාධනය අහිමිවන ප්‍රමාණය $(A+B+C+D+E+F+G)-(A+B+C+D+E)$

$=F+G$

(ලකුණු 02)



Visit EDUHUB

(iv) - රුපියල් 72 ක අවම මිල සීමාවක් පනවනු ලැබූ විට අහිමිවන ශුභ සාධනයේ ප්‍රමාණය


- මිල පාලනයට පෙර ආර්ථික අතිරික්තය සහ මිල පාලනයට පසු ආර්ථික අතිරික්තය සංසන්දනය කිරීමෙන් ශුභ සාධනයේ අහිමිවීම ගණනය කළ හැකිය.

- වෙළෙඳපොළ සමතුලිතය :

$Q_D = Q_S$

$Q_D = 180 - 2P \qquad Q_S = -15 + P$

$180 - 2P = -15 + P; \quad 195 = 3P; \quad P = 65; \quad Q = 180 - 2(65) = 180 - 130 = 50$




(නිවැරදි රූප සටහනට ලකුණු 03 යි)

අවම මිලට පෙර :

- පාරිභෝගික අතිරික්තය $= \frac{(90 - 65) \times 50}{2} = \frac{1250}{2} = 625$ (ලකුණු 01 යි)

- නිෂ්පාදක අතිරික්තය $= \frac{(65 - 15) \times 50}{2} = \frac{2500}{2} = 1250$ (ලකුණු 01 යි)

- අවම මිලට පෙර ආර්ථික අතිරික්තය = පාරිභෝගික අතිරික්තය + නිෂ්පාදක අතිරික්තය
  $= 625 + 1250 = 1875$

- අවම මිල ප්‍රතිපත්තියට පසු ආර්ථික අතිරික්තය : රුපියල් 72 ක් ලෙස අවම මිල නියම කළ විට පාරිභෝගික ඉල්ලුම ඒකක 36 ක් දක්වා පහළ වැටේ. එහි ප්‍රතිඵල වශයෙන් පාරිභෝගික අතිරික්තයත් නිෂ්පාදක අතිරික්තයත් දෙකම මෙහිදී අඩුවේ.

  පාරිභෝගික අතිරික්තය $= \frac{(90 - 72) \times 36}{2} = \frac{18 \times 36}{2} = \frac{648}{2} = 324$ (ලකුණු 01 යි)

  නිෂ්පාදක අතිරික්තය $= \frac{(57 + 21) \times 36}{2} = \frac{2808}{2} = 1404$ (ලකුණු 01 යි)

  අවම මිලෙන් පසු ආර්ථික අතිරික්තය $= 324 + 1404 = 1728$

  අහිමි වුණු ශුභ සාධනය = පෙර ආර්ථික අතිරික්තය - පසු ආර්ථික අතිරික්තය
  $= 1875 - 1728 = 147$ (ලකුණු 01)




Visit EDUHUB

**විකල්ප පිළිතුරක් :**

අඩුම මිල නියම කළ පසුව ඉල්ලුම් ප්‍රමාණය අඩුවීම නිසා නිෂ්පාදනයේ සංකෝචනයක් හටගනී. රූප සටහනින් දැක්වෙන ආකාරයට ඉල්ලුම් ප්‍රමාණය ඒකක 50 සිට 36 දක්වා අඩුවේ. මෙහි ප්‍රතිඵල වශයෙන් පාරිභෝගික අතිරික්තයත් නිෂ්පාදන අතිරික්තයක් අවම මිල ප්‍රතිඵලයට පෙර තිබුණු ප්‍රමාණයට වඩා අඩුවේ. රූප සටහනෙහි A සහ B ත්‍රිකෝණ පෙන්නුම් කරන්නේ මෙලෙස අහිමිවන අතිරික්තයන්ය. A සහ B ත්‍රිකෝණවල වර්ගඵලය ගණනය කිරීමෙන් අහිමිවන ශුභ සාධනය ඇස්තමේන්තු කළ හැකිය.

(ලකුණු 02 යි)




(නිවැරදි රූප සටහනට ලකුණු 03 යි)

- A ත්‍රිකෝණය අහිමිවන පාරිභෝගික අතිරික්තය පෙන්නුම් කරයි. එහි විශාලත්වය : $\frac{(72 - 65)x(50 - 36)}{2} = \frac{7 \times 14}{2} = \frac{98}{2} = 49$ (ලකුණු 01 යි)

- B ත්‍රිකෝණය අහිමිවන නිෂ්පාදක අතිරික්තය පෙන්නුම් කරයි. එහි විශාලත්වය $\frac{(65 - 51)x(50 - 36)}{2} = \frac{14 \times 14}{2} = \frac{196}{2} = 98$ (ලකුණු 01 යි)

- අහිමිවන මුළු ශුභ සාධනයේ ප්‍රමාණය $= A+B$

  $= 49+98$

  $= 147$ (ලකුණු 01 යි)



Visit EDUHUB

**04 වන ප්‍රශ්නය**

**4.** (i) නිෂ්පාදන ශ්‍රිතයක් යනු කුමක් ද? කෙටි කාලීන සහ දිගු කාලීන නිෂ්පාදන ශ්‍රිත අතර වෙනස දක්වන්න. (ලකුණු 03යි)

(ii) ආර්ථික පිරිමැසුම් සහ ආර්ථික නොපිරිමැසුම් හට ගැනීමට හේතු මොනවා ද? (ලකුණු 04යි)

(iii) ආර්ථික ලාභය, නිෂ්පාදක අතිරික්තය සහ ස්ථාවර පිරිවැය අතර සම්බන්ධතාව කුමක් ද? (ලකුණු 03යි)

(iv) ආර්ථික බද්ධ කුලිය යනු කුමක් ද? නිෂ්පාදන සාධකයකට ආර්ථික බද්ධ කුලියක් උපයා ගත හැකිවනුයේ කවර තත්ත්වයන් යටතේ දී ද? (ලකුණු 04යි)

(v) පූර්ණ තරගකාරී කර්මාන්තයක ආයතනවල කෙටි කාලීන සැපයුම් වක්‍ර මගින් කර්මාන්තයේ කෙටි කාලීන සැපයුම් වක්‍රය ව්‍යුත්පන්න කරගන්නේ කෙසේ ද? යෝග්‍ය රූපසටහන් භාවිත කරමින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

04. (i) - යෙදවුම් සහ නිමැවුම් අතර පවත්නා තාක්ෂණික සම්බන්ධතාවක් වශයෙන් නිෂ්පාදන ශ්‍රිතය හැඳින්විය හැකිය. කිසියම් යෙදවුම් ප්‍රමාණයකින් ලබාගත හැකි උපරිම නිමැවුම් ප්‍රමාණය නිෂ්පාදන ශ්‍රිතයක් මගින් පෙන්නුම් කෙරේ.

- ශ්‍රමය (L) සහ ප්‍රාග්ධනය (K) වශයෙන් යෙදවුම් දෙකක් පමණක් භාවිතා කෙරෙන නිෂ්පාදන ක්‍රියාවලියක් නිෂ්පාදන ශ්‍රිතයක ස්වරූපයෙන් පහත දැක්වෙන ආකාරයට ප්‍රකාශ කළ හැකිය.

$$Q = f(K, L)$$ (ලකුණු 01 යි)

- නිෂ්පාදනය සඳහා ශ්‍රමය සහ ප්‍රාග්ධනය පමණක් නොව කාලයද අවශ්‍ය වේ. නිෂ්පාදන ක්‍රියාවලියට කාලය බලපාන ආකාරය පැහැදිලි කිරීම සඳහා කාලපරිච්ඡේද දෙකක් වෙන්කොට දැක්වේ. ඒ කෙටි කාලය සහ දිගුකාලය වශයෙනි.

- කෙටි කාලීන නිෂ්පාදන ශ්‍රිතයක් තුළ යෙදවුම් ප්‍රභේද දෙකක් දක්නට ලැබේ. ඒවා නම් විචල්‍ය යෙදවුම් (V) සහ ස්ථාවර යෙදවුම් (F)ය. කෙටිකාලයේ දී වෙනස් කළහැකි යෙදවුම් විචල්‍ය යෙදවුම් ලෙසත් එලෙස වෙනස් කළ නොහැකි යෙදවුම් ස්ථාවර යෙදවුම් ලෙසත් හැඳින්වේ. කෙටිකාලයේ දී නිමැවුම වෙනස් කළ හැක්කේ ශ්‍රමය, අමුද්‍රව්‍ය වැනි විචල්‍ය යෙදවුම් වෙනස් කිරීම මගින් පමණි. ප්‍රාග්ධනය වැනි ස්ථාවර යෙදවුම් කෙටි කාලයේදී වෙනස් කළ නොහැකිය. කෙටිකාලීන නිෂ්පාදන ශ්‍රිතයක් මෙලෙස දැක්විය හැකිය.

$$Q = f(V, F)$$ (ලකුණු 01 යි)

- දිගු කාලය වශයෙන් හඳුන්වනු ලබන්නේ සියලුම යෙදවුම් වෙනස් කිරීමට ප්‍රමාණවත් කාලයයි. එබැවින් දිගු කාලීන නිෂ්පාදන ශ්‍රිතයක් තුළ ඇත්තේ විචල්‍ය යෙදවුම්ය. දිගු කාලයේ දී ප්‍රාග්ධනයත් විචල්‍ය යෙදවුමක් බවට පත්වේ. (ලකුණු 01 යි)

(ii) පරිමාණානුකූල පිරිමැසුම් සඳහා බලපාන හේතු :

- ශ්‍රමය භාවිත කිරීමේදී විශේෂ ප්‍රාගුණ්‍යනය ඉහළ යාම.
- කළමනාකාරීත්ව විශේෂ ප්‍රාගුණ්‍යනය
- ප්‍රාග්ධන උපකරණ වඩාත් කාර්යක්ෂම උපයෝජනය වීම.
- අලෙවි කිරීමේ පරිමාණානුකූල පිරිමැසුම්
- මූල්‍යමය පරිමාණානුකූල පිරිමැසුම්
- අවදානම් දැරීම සම්බන්ධයෙන් ඇති පරිමාණානුකූල පිරිමැසුම්

**(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු දෙකකට ලකුණු 02 යි)**



Visit EDUHUB

**පරිමාණානුකූල නොපිරිමැසුම් සඳහා බලපාන හේතු:**

- මහා පරිමාණ නිෂ්පාදන ආයතනයක් පැන නගින කළමනාකාරීත් හා සම්බන්ධීකරණ ගැටලු

- එක්තරා සීමාවක් කරා ළඟා වූ පසු විශාල තොග වශයෙන් අමුද්‍රව්‍ය යනාදිය ලබා ගැනීමේ වාසි ක්‍රමයෙන් පහව යනු ඇත. ඇතැම් ප්‍රධාන අමුද්‍රව්‍යවල සැපයුම සීමා විය හැකිය. ඉන්පසු පිරිවැය ඉහළ නගී.

- විශාල පරිමාණ නිෂ්පාදන ක්‍රියාවලි සතු ශ්‍රමිකයන් පිටස්තරයන්ය (alienation) යන හැඟීමක් ඇතිවිය හැකි අතර එමගින් කාර්යක්ෂමතාව අඩුවිය හැකිය.

- ප්‍රධාන කාර්යාලයෙන් දුරස්ථ ස්ථානයන්හි අළුත් ශාඛා ආරම්භ කිරීම නිසා ප්‍රවාහන වියදම් ඉහළ යාම.

- කම්කරු සම්බන්ධතා දුර්වල වීම නිසා කාර්මික ආරවුල් ඇතිවීමත් එමගින් ඵලදායිතාව අඩුවීම සහ පිරිවැය ඉහළ යාම.

**(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු දෙකකට ලකුණු 02 යි)**

(iii) - මුළු පිරිවැය (මුළු විචල්‍ය පිරිවැය සහ මුළු ස්ථාවර පිරිවැය) ඉක්මවූ මුළු අයභාරයේ ප්‍රමාණය ආර්ථික ලාභය වශයෙන් සැලැකේ. (ලකුණු 01 යි)

- නිෂ්පාදක අතිරික්තය ලෙස සැලැකෙන්නේ මුළු විචල්‍ය පිරිවැය ඉක්මවූ මුළු අයභාරයේ ප්‍රමාණයයි. (ලකුණු 01 යි)

- ආර්ථික ලාභය ගණනය කිරීමේදී ස්ථාවර පිරිවැය සැලකිල්ලට ගන්නා නමුදු නිෂ්පාදක අතිරික්තය ගණනය කිරීමේදී ස්ථාවර පිරිවැය සැලකිල්ලට නොගැනේ. එබැවින් මුළු ස්ථාවර පිරිවැයේ ප්‍රමාණයෙන් නිෂ්පාදක අතිරික්තය ආර්ථික ලාභ ඉක්මවා යයි. (ලකුණු 01 යි)

(iv) - කිසියම් නිෂ්පාදන සාධකයක හිමිකරුවෙක් එම සාධකය පවත්නා භාවිතයෙහි රඳවා තබා ගැනීම සඳහා අපේක්ෂා කරනු ලබන අවම ගෙවීම ඉක්මවා උපයා ගන්නා ආදායම ආර්ථික බදු කුලිය ලෙස හැඳින්වේ. (ලකුණු 01 යි)

- කිසියම් සාධකයක් පවත්නා භාවිතයෙහි රඳවා තබා ගැනීමට පෙළඹවීම සඳහා අපේක්ෂා කරන අවම ආදායම එම භාණ්ඩයේ ආවස්ථික පිරිවැය වේ. මෙම ආවස්ථික පිරිවැය සාධකයේ සංක්‍රාම ඉපැයීම ලෙස ද නම් කෙරේ. (ලකුණු 01 යි)

- නිෂ්පාදන සාධකයක ආදායමින් ආර්ථික බදු කුලිය ප්‍රමාණය කොපමණදැයි තීරණය වනුයේ එම සාධකයේ සැපයුම් නම්‍යතාව මතය. සාධකයක සැපයුම පූර්ණ අනම්‍යවේනම් එම සාධකය උපයන සම්පූර්ණ ආදායමම ආර්ථික බදු කුලියක් වේ. සාධකයේ සැපයුම පූර්ණ නම්‍යවේනම් සාධක ආදායමේ කිසිවක් ආර්ථික බදු කුලියට ඇතුළත් නොවේ. (ලකුණු 01 යි)



Visit EDUHUB


- සාමාණයෙන් කිසියම් සාධකයක සැපයුම පූර්ණ අනම්‍ය හෝ පූර්ණ නම්‍ය හෝ නොවේ නම් සාධක ආදායමේ කිසියම් කොටසක් ආර්ථික බදු කුලියෙන්ද සෙසු කොටස් ආවස්ථික පිරිවැය හෙවත් සංක්‍රාම ඉපැයීමෙන්ද සමන් වී තිබේ. ඒ අනුව සැපයුමේ කිසියම් අනම්‍යතාවක් ඇත්නම් ඕනෑම සාධකයකට ආර්ථික බදු කුලී ඉපයිය හැකිය. (ලකුණු 01 යි)

(v) - නිෂ්පාදන ආයතනවල කෙටි කාලීන සැපයුම් වක්‍ර සමන්විත වනුයේ අවම සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රයට ඉහළින් පිහිටි ආන්තික පිරිවැය වක්‍ර වලිනි. අවම විචල්‍ය පිරිවැයට වඩා පහළ මිලයන්හිදී ආයතනයේ සැපයුම ශුන්‍ය වන අතර සැපයුම් වක්‍රය මිල අක්ෂය දිගේ ගමන් කරයි. (ලකුණු 01 යි)


- එක් එක් මිලයන්හිදී සියලුම ආයතන සපයන භාණ්ඩ ප්‍රමාණ එකතු කිරීමෙන් කර්මාන්තයේ කෙටිකාලීන සැපයුම් වක්‍රය ව්‍යුත්පන්න කරගත හැකිය. මෙහිදී ආයතන සංඛ්‍යාව සහ එක් එක් ආයතනයේ ධාරිතාව නොවෙනස්ව පවතී යයි උපකල්පනය කෙරේ. එනම් ආයතනවල කෙටිකාලීන සැපයුම් වක්‍ර තිරස් අතට එකතු කිරීමෙන් කර්මාන්තයේ කෙටි කාලීන සැපයුම් වක්‍රය ලබා ගත හැකිය. (ලකුණු 01 යි)

- ආයතනය වසා දමන ලක්ෂ්‍යයට අදාළ මිලේදී (අවම විචල්‍ය පිරිවැයට සමාන මිල) කර්මාන්තයේ සැපයුම් වක්‍රය ප්‍රමාණ අක්ෂයට සමාන්තරව ගමන් කරන අතර ඊට වඩා පහළ මිලයන්හි දී සැපයුම ශුන්‍ය වේ. (ලකුණු 01 යි)

- යෝග්‍ය රූපසටහන්




ආයතනයේ සැපයුම් වක්‍රය




කර්මාන්තයේ සැපයුම් වක්‍රය

(ආයතනයේ කෙටිකාලීන සැපයුම් වක්‍රය සහිත නිවැරදි රූප සටහනට ලකුණු 01 යි. කර්මාන්තයේ කෙටිකාලීන සැපයුම් වක්‍රය සහිත නිවැරදි රූප සටහනට ලකුණු 02 යි. මුළු ලකුණු 03 යි)



Visit EDUHUB

## 05 වන ප්‍රශ්නය

5. (i) ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේ දී පහත දැක්වෙන ක්‍රියාකාරකම් ඇතුළත් කරගනු ලැබේ ද නැද්ද යන්න සඳහන් කොට, ඔබේ පිළිතුරට හේතු පැහැදිලි කරන්න.

(a) ශ්‍රී ලාංකික සමාගමක් මගින් අලුතින් නිකුත් කරනු ලැබූ රුපියල් මිලියන 1ක කොටස් ආයෝජකයෙක් විසින් මිලදී ගැනීම.

(b) රුපියල් මිලියන 50ක් වටිනා නව නිවසක් ඉදිකිරීම.

(c) කොළඹ නගරයේ ආපනශාලාවකට රුපියල් 50 000ක මාළු ධීවරයෙකුගෙන් මිලට ගැනීම.

(d) ගොවියෙක් යාබද වනාන්තරයකින් රුපියල් 5 000ක් වටිනා මී පැණි එකතුකර ගැනීම.

(e) විශ්වවිද්‍යාලයක පර්යේෂණ කණ්ඩායමක් විසින් රුපියල් මිලියන 10ක් වැයකොට කෝවිඩ්-19 වසංගතයේ ආර්ථික ප්‍රතිවිපාක පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘතියක් නිමකිරීම.

(ලකුණු 01 × 5 = 05යි)

(ii) කල්පිත ආර්ථිකයක් පිළිබඳ පහත සඳහන් දත්ත ඔබ වෙත ලබා දී ඇත.

| අයිතමය | වටිනාකම (රු. බිලියන) |
|---|---|
| සමාහාර පරිභෝජන වියදම | 10 000 |
| දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | 4 000 |
| භාණ්ඩ හා සේවා අපනයන | 3 500 |
| භාණ්ඩ හා සේවා ආනයන | 4 500 |
| අවශේෂ ලෝකයෙන් ලැබුණු ශුද්ධ ප්‍රාථමික ආදායම | – 400 |
| අවශේෂ ලෝකයෙන් ලැබුණු ශුද්ධ ජංගම සංක්‍රාම | 1 000 |

ඉහත දත්ත පදනම් කරගනිමින් පහත සඳහන් දෑ ගණනය කරන්න.

(a) දළ ජාතික ආදායම (ලකුණු 02යි)

(b) දළ ජාතික ඉතුරුම් (ලකුණු 02යි)

(iii) පහත සඳහන් ආකෘතිය රජයේ කටයුතු නොමැති ආවෘත ආර්ථිකයක් නිරූපණය කරයි.

$C = 500 + 0.8Y$ $\quad$ $I = 600$ (සියලුම අගයන් රුපියල් බිලියනවලිනි)

(a) මෙම ආර්ථිකයේ ස්වායත්ත වියදම් ප්‍රමාණය කොපමණ ද? (ලකුණු 02යි)

(b) සමාහාර නිමැවුමේ සමතුලිත අගය කොපමණ ද? (ලකුණු 02යි)

(c) ආයෝජන ගුණකයේ අගය කුමක් ද? (ලකුණු 02යි)

(iv) යෝග්‍ය රූපසටහන් භාවිත කරමින් සමාහාර වියදම් ශ්‍රිතය සහ සමාහාර ඉල්ලුම් වක්‍රය අතර වෙනස්කම් පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

05. (i) (a) දළ දේශීය නිෂ්පාදිතයට ඇතුළත් නොවේ.
කොටස් මිලයට ගැනීම මූල්‍යමය ගනු දෙනුවක් වන අතර එකතු කළ අගයන් බිහි නොකරයි.

(b) දළ දේශීය නිෂ්පාදිතයට ඇතුළත් වේ.
එකතු කළ අගයක් ජනනය කෙරෙන නිෂ්පාදන ක්‍රියාවකි.

(c) දළ දේශීය නිෂ්පාදිතයට ඇතුළත් නොවේ.
මසුන් ආපන ශාලා සේවාව සැපයීමේදී යොදා ගැනෙන අතරමැදි යෙදවුමකි.

(d) දළ දේශීය නිෂ්පාදිතයට ඇතුළත් වේ.
නිෂ්පාදන ඉම තුළට ඇතුළත් වන ඵලදායී ක්‍රියාකාරකමකි.



Visit EDUHUB

(e) දළ දේශීය නිෂ්පාදිතයට ඇතුළත් වේ.
නිෂ්පාදන ඉම තුළට ඇතුළත් වන ඵලදායි ක්‍රියාකාරකමකි.

**(එක් නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින් ලකුණු 05 යි)**

(ii) (a) දළ ජාතික ආදායම ගණනය කිරීම.

- දළ දේශීය නිෂ්පාදිතය = සමාහාර පරිභෝජන වියදම + දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය + (භාණ්ඩ හා සේවා අපනයන - භාණ්ඩ හා සේවා ආනයන)

දළ දේශීය නිෂ්පාදිතය = 10000 + 4000 + (3500 - 4500)
= 10000 + 4000 + (-1000) = රු.බිලියන 13000

**(ලකුණු 01 යි)**

- දළ ජාතික ආදායම = ද.දේ.නි. + විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම
= 13000 + (-400)
= රුපි. බිලියන 12,600 **(ලකුණු 01 යි)**

(b) දළ දේශීය ඉතුරුම් ($S_D$) = ද.දේ.නි. - සමාහාර පරිභෝජන වියදම
$S_D$) = 13000 - 10000
= රුපි. බිලියන 3000 **(ලකුණු 01 යි)**

දළ ජාතික ඉතුරුම් ($S_N$) = දළ දේශීය ඉතුරුම් + විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම + විදේශීය ශුද්ධ ජංගම සංක්‍රාම
$S_N$ = 3000 + (- 400) + 1000 = 3600
= රුපි. බිලියන 3600 **(ලකුණු 01 යි)**

(iii) (a) ආර්ථිකයේ ස්වායත්ත වියදම්වල ප්‍රමාණය :
= ස්වායත්ත පරිභෝජන වියදම් + ස්වායත්ත ආයෝජන වියදම්

**(ලකුණු 01 යි)**

= 500 + 600 = රුපි. බිලියන 1100 **(ලකුණු 01 යි)**

(b) සමතුලිත ආදායම :

$$Y = C + I$$
$$Y = 500 + 0.8Y + 600;$$ **(ලකුණු 01 යි)**
$$Y = 1100 + 0.8Y$$
$$0.2Y = 1100;$$
Y = රුපි. බිලියන 5500 **(ලකුණු 01 යි)**

(c) ආයෝජන ගුණකය = $\frac{1}{1 - mpc} = \frac{1}{1 - 0.8}$ **(ලකුණු 01 යි)**

$= \frac{1}{0.2} = 5$ **(ලකුණු 01 යි)**




Visit EDUHUB

(iv) - සමාහාර වියදම් ශ්‍රිතය පෙන්නුම් කරනුයේ එක් එක් ආදායම් මට්ටම් වලදී අවසාන නිෂ්පාදිතය මිලදී ගැනීමට නිෂ්පාදන ආයතන සහ කුටුම්බ විසින් වැයකරනු ලබන මුදල් ප්‍රමාණයයි.

සරල ආර්ථිකයක සමාහාර වියදම් ශ්‍රිතය සමාහාර පරිභෝජන (C) සහ ආයෝජන (I) ශ්‍රිතයන්ගේ එකතුවට සමානය. **(ලකුණු 01 යි)**


- සමාහාර වියදම් ශ්‍රිතය රූප සටහනක් මගින් දැක්වීම.




**(නිවැරදි රූපසටහනට ලකුණු 02 යි)**

- සමාහාර ඉල්ලුම් වක්‍රයෙන් පෙන්නුම් කරනුයේ එක් එක් මිල මට්ටම් වලදී දේශීය පාරිභෝගිකයන් ව්‍යාපාරික අංශය, රජය සහ විදේශීය ගැනුම්කරුවන්, සාමූහිකව මිලදී ගැනීමට කැමැති භාණ්ඩ හා සේවා ප්‍රමාණයන්ය. **(ලකුණු 01 යි)**

- රූප සටහන් මගින් සමාහාර ඉල්ලුම් වක්‍රය දැක්වීම.




**(නිවැරදි රූප සටහනකට ලකුණු 01 යි)**



Visit EDUHUB

'ආ' උප කොටස

(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** තෝරා ගන්න.)

**06 වන ප්‍රශ්නය**

**6.** (i) මුදල් ප්‍රමාණවාදය යනු කුමක් ද? (ලකුණු 04යි)

(ii) උද්ධමනයෙහි පිරිවැය කවරේ ද? (ලකුණු 04යි)

(iii) මුදලට ඇති ඉල්ලුමෙහි ප්‍රධාන නිශ්චායක කවරේ ද? (ලකුණු 03යි)

(iv) ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන කාර්යයන් **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04යි)

(v) යම් දෙන ලද කාල පරිච්ඡේදයක් තුළ කිසියම් ආර්ථිකයක මුළු මුදල් තොගය (M) රුපියල් බිලියන 6 400ක් ද, මහජනයා සතු මුළු බැංකු තැන්පතු (D) රුපියල් බිලියන 5 200ක් ද, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 10%ක් ද, බැංකු සතු අධි සංචිත ප්‍රමාණය රුපියල් බිලියන 280ක් ද බව උපකල්පනය කරන්න.

(a) මෙම ආර්ථිකයේ මුළු අධිබල මුදල් ප්‍රමාණය කොපමණ ද? (ලකුණු 03යි)

(b) මුදල් ගුණකයේ අගය කොපමණ ද? (ලකුණු 02යි)

06. (i) - මුදල් තොගය සහ පොදු මිල මට්ටම අතර අනුලෝම සම්බන්ධතාවක් පවතින බව මුදල් ප්‍රමාණවාදය පුරෝකථනය කරයි. එනම් මුදල් ප්‍රමාණයේ හටගන්නා වෙනස්වීමක් මිට මට්ටමේ සමානුපාතික වෙනසක් ඇති කරනු ලැබේ. උදාහරණයක් වශයෙන් මුදල් තොගය දෙගුණ කරනු ලැබුවහොත් මිල මට්ටමද දෙගුණ වනු ඇත. ස්ථාවර මුදල් සැපයුමක් ස්ථාවර මිල මට්ටමක් බිහිකරනු ඇත.

**(ලකුණු 02 යි)**

- මුදල් තොගය හා මිල මට්ටම අතර සම්බන්ධය පෙන්වාදීම සඳහා මුදල් ප්‍රමාණවාදය භාවිත කරනුයේ MV = PT නැතහොත් MV = PY යන විනිමය සමීකරණයයි. මෙම සමීකරණය තුළ අඩංගු විචල්‍යයන්ගේ හැසිරීම සම්බන්ධයෙන් කරනු ලබන උපකල්පන පදනම් කර ගනිමින් විනිමය සමීකරණය මිල මට්ටම තීරණය කෙරෙන න්‍යායක් (මුදල් ප්‍රමාණවාදය) බවට පෙරළාගත හැකිය.. (ලකුණු 01 යි)

- මුදලේ සංසරණ ප්‍රවේගය (V) ස්ථාවරව පවතින බවත් පූර්ණ සේවා නියුක්තිය (Y හෝ T ස්ථාවරය) පවතින බවත් යන උපකල්පන මත මුදල් තොගයේ (M) වෙනස් වීමක් සෘජුවම මිල මට්ටමෙහි සමානුපාතික වෙනසක් ඇතිකරන බව මෙම න්‍යාය පුරෝකථනය කරයි. (ලකුණු 01 යි)

(ii) උද්ධමනයේ පිරිවැය

- ජීවන වියදම ඉහළ යාම නිසා මහජනතාවගේ ජීවන තත්ත්වය පහළ වැටේ.

- නිරපේක්ෂ දරිද්‍රතා මට්ටම ඉහළ යාම.

- අසාධාරණ ව්‍යාප්ති ප්‍රතිවිපාක බිහිකරයි. වියපත් පුද්ගලයන්, විශ්‍රාම වැටුප් මත යැපෙන සමාජයේ දුබල කොටස් උද්ධමනයෙන් පීඩනයට පත්වන අතර වඩා ශක්තිමත් කේවෙල් කිරීමේ ශක්තිය වැඩි අය වැඩි ප්‍රතිලාභ හිමිකර ගනී.

- විනිමය අනුපාතිකය අධි තක්සේරු වීම නිසා අපනයන තරගකාරීත්වය අඩුවීමත්



Visit EDUHUB

ආනයන ධෛර්යමත් වීමත් නිසා වෙළෙඳ ශේෂය කෙරෙහි අයහපත් බලපෑමක් ඇතිවේ.

- වැඩිවන ජීවන වියදමට එරෙහිව ගනු ලබන වෘත්තීය සමිති අරගල හේතුවෙන් ආර්ථික ක්‍රියාකාරකම්වලට බාධා පැමිණෙනු ඇත.

- ණයහිමියන් සහ ණයගැතියන් අතරද අසාධාරණ ව්‍යාප්ති ප්‍රතිවිපාක ඇතිවේ. උද්ධමනකාරී තත්ත්වයකදී පොලී අනුපාතිකය උද්ධමන අනුපාතිකයට වඩා පහළින් තිබිය හැකිය. මූර්ත පොලී අනුපාතිකය සෘණ අගයක් ගත හැකිය. එය ණය ගැතියන්ට වාසිදායක වන අතර ණයහිමියන්ට අවාසිදායක වේ. මේ අනුව උද්ධමනය ණය හිමියන් වෙතින් ණයගැතියන් කරා ධනය පුනර්ව්‍යාප්තියක් ඇති කරයි.

- උද්ධමන විවිධ ස්වරූපයේ ආර්ථික චර්යාවන් විකෘති කරන අතර ආර්ථික කාරක මත පිරිවැයක් ඇති කරයි. පාරිභෝගික චර්යාව විකෘති කරමින් අනාගත මිල ඉහළ යාම් අපේක්ෂාවෙන් වර්තමානයේ වැඩි වැඩියෙන් මිලදී ගැනීම් සඳහා පාරිභෝගිකයෝ පෙළඹෙති. වෙළෙඳසැල් භාණ්ඩ නොවිකුණා සඟවා තබා ගැනීමට තැත්කරනු ලැබේ.

- උද්ධමනය ව්‍යාපාරික ආයතන මත අවිනිශ්චිතතා ඇති කරයි. දිගුකාලීන සැලසුම් ඇතිකර ගැනීම අපහසු වේ. ආයතන තම අරමුදල් ඵලදායි ආයෝජන වෙතින් ඉවත් කොට සමපේක්ෂණ ක්‍රියාවන්හි යොමු කරයි.

- 'සපත්තු සම් පිරිවැය' සහ 'මෙනුපත් පිරිවැය' උද්ධමනීය තත්ත්වයන් යටතේ පාරිභෝගිකයෝ අඩුමිලට භාණ්ඩ ලබාගත හැකි තැන් සොයමින් කාලය හා සම්පත් විනාශ කර ගනිති. වෙළෙඳසැල් ද නිතර නිතර තමන්ගේ භාණ්ඩ මිල දර්ශනයන් අළුත් කරමින් නව මිල දර්ශන මුද්‍රණය කරයි.

**(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම අවාසිදායක කරුණු හතරකට ලකුණු 04 යි)**

(iii)
- මූර්ත ආදායම
- මිල මට්ටම
- පොලී අනුපාතිකය
- අනාගත උද්ධමනය හා පොලී අනුපාතික පිළිබඳ අපේක්ෂා
- මූල්‍ය නවත්‍යතාවන්

**(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු තුනකට ලකුණු 03 යි)**

(iv) ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන කාර්යයන් :
- මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාවට නැගීම.
- විනිමය අනුපාතික ප්‍රතිපත්තිය මෙහෙයවීම.
- නිල ජාත්‍යන්තර සංචිත කළමනාකරණය
- මූල්‍ය පද්ධතිය අධීක්ෂණය කිරීම.
- බැංකු හා තෝරාගත් බැංකු නොවන මූල්‍ය ආයතන සඳහා බලපත්‍ර ලබාදීම, නියාමනය කිරීම සහ අධීක්ෂණය කිරීම.
- ගෙවීම් පද්ධතිය නියාමනය කිරීම සහ එය කාර්යක්ෂමව කිරීමට පහසුකම් සැපයීම.



Visit EDUHUB

- ව්‍යවහාර මුදල් නිකුත් කිරීම.
- ආර්ථික දත්ත රැස්කිරීම හා බෙදාහැරීම
- රජයේ බැංකුකරුවා සහ මූල්‍ය උපදේශක වශයෙන් ක්‍රියා කිරීම.

**(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු හතරකට ලකුණු 04 යි)**

(v) (a) ආර්ථිකයේ අධිබල මුදල් (H) ප්‍රමාණය :

= මහජනතාව සතු ව්‍යවහාර මුදල් ($C_P$) + වාණිජ බැංකු සතු ව්‍යවහාර මුදල් ($C_B$)

- මහජනයා සතු ව්‍යවහාර මුදල් ($C_P$) = මුළු මුදල් තොගය (M) - මහජනයා සතු බැංකු තැන්පතු (D)

= 6400 - 5200 = 1200 **(ලකුණු 01 යි)**

- වාණිජ බැංකු සතු ව්‍යවහාර මුදල් ($C_B$) = අවශ්‍ය සංචිත ප්‍රමාණය + අධි සංචිත ප්‍රමාණය

අවශ්‍ය කරන සංචිත ප්‍රමාණය = rD = 0.10 (5200) = 520

අධි සංචිත ප්‍රමාණය = 280

වාණිජ බැංකු සතු ව්‍යවහාර මුදල් ($C_B$) = 520 + 280 = 800 **(ලකුණු 01 යි)**

- මුළු අධිබල මුදල් ප්‍රමාණය = $C_P + C_B$ = 1200 + 800

= රුපියල් බිලියන 2000 **(ලකුණු 01 යි)**

(b) මුදල් ගුණකය (M) = $\frac{M}{H}$ $\frac{\text{මුළු මුදල් තොගය}}{\text{අධිබල මුදල්}}$ **(ලකුණු 01 යි)**

$= \frac{6400}{2000} = \frac{16}{5} = 3.2$

**(ලකුණු 01 යි)**

**විකල්ප පිළිතුර**

මුදල් ගුණකය $= \frac{1+c}{c+r+er}$

c = තැන්පතු හා ව්‍යවහාර මුදල් අතර අනුපාතය (C / D = 1200 / 5200 = 0.23)

r = ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය : 10%

er = අධි සංචිත අනුපාතය (ER / D) = 280 / 5200 = 7/130 = 0.05

මුදල් ගුණකය (m) = 1 + c / c+ r +er = 1 + 0.23/0.23 + 0.010 + 0.05) = 1.023/0.38= 3.24

**(ලකුණු 02 යි)**

## 07 වන ප්‍රශ්නය

7. (i) පහත දැක්වෙන භාණ්ඩ හා සේවා ශුද්ධ පොදු භාණ්ඩ ලෙස සැලකිය හැකි ද? නොහැකි ද? යන්න සඳහන් කොට ඔබේ පිළිතුරට හේතු දක්වන්න.
   (a) ප්‍රදීපාගාර
   (b) සාගර මසුන්
   (c) අන්තර්ජාලය (ලකුණු 03යි)

   (ii) ශුභ සාධන භාණ්ඩ **දෙකක්** නම් කොට ඒවා ශුභ සාධන භාණ්ඩ වශයෙන් සැලකෙන්නේ ඇයි ඇයි පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

   (iii) 'විසර්ජන පනත' සහ 'අනුරූ සම්මත ගිණුම' අතර වෙනස දක්වන්න. (ලකුණු 04යි)

   (iv) මෑත වර්ෂවල දී ශ්‍රී ලංකා රජයේ බදු නොවන අයභාර මූලාශ්‍ර කවරේ ද? (ලකුණු 04යි)

   (v) නිදහස් වෙළෙඳපොළක් තුළ ඍණ බාහිරතා සහිත භාණ්ඩයක් අධි නිෂ්පාදනයකට යොමුවන්නේ ඇයි? රූපසටහනක් යොදා ගනිමින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 05යි)



Visit EDUHUB

07. (i) (a) **ප්‍රදීපාගාර** : ශුද්ධ පොදු භාණ්ඩයක් වේ. ප්‍රදීපාගාර සේවාව භුක්ති විඳීමේදී පාරිභෝජන තරගකාරීත්වයක් නොසිදුවන අතර පරිභෝජනය කරන්නන් වැළැක්වීමේ හැකියාවක්ද නොමැත. එම සේවාව ස්ථාපිත කළ පසු සියල්ලන්ටම එකසේ භුක්ති විඳිය හැකිය.

(b) **සාගරයේ මසුන්** : ශුද්ධ පොදු භාණ්ඩයක් නොවන අතර පොදු සම්පතක් වේ. සාගර මසුන් ඇල්ලීම වළක්වාලිය නොහැකි වෙතත් මසුන් ඇල්ලීමේ දී තරගකාරීත්වයක් හටගනී. එක් පුද්ගලයෙක් අල්ලා ගත් මසුන් නිසා තවත් පුද්ගලයෙකුට අල්ලා ගත හැකි මසුන් ප්‍රමාණය අඩු වනු ඇත.

(c) **අන්තර් ජාලය** : ශුද්ධ පොදු භාණ්ඩයක් නොවේ. පරිභෝජනය වළක්වා ලිය හැකිය. එහෙත් එක් අයෙකුගේ පරිභෝජනය නිසා තවත් අයෙකුට ලබා ගත හැකි සේවාවේ අඩුවක් ඇති නොවේ. හැම විටම සාමූහිකව පාරිභෝජනය කළ හැකිය.

**(ලකුණු 01 බැගින් ලකුණු 03 යි)**

(ii) ශුභ සාධන භාණ්ඩ :

- සෞඛ්‍ය සේවා
- ප්‍රාථමික අධ්‍යාපනය
- ළමයින් සඳහා එන්නත් ලබාදීම.
- සේවක පුහුණු වැඩ සටහන්
- මහජන පුස්තකාල
- කෞතුකාගාර

**(එක් සේවාවකට ලකුණු 01 බැගින් ඕනෑම සේවා දෙකකට ලකුණු 02 යි)**

- මෙම සේවා ශුභ සාධන භාණ්ඩ ලෙස සැලකෙන්නේ ඒවා පරිභෝජනය කිරීමේදී ධන බාහිරතා ජනනය වන බැවිනි. ඒවා පරිභෝජනය කිරීම නිසා පාරිභෝගිකයාට ලැබෙන පෞද්ගලික ප්‍රතිලාභයට වඩා සමස්ත සමාජයට ලැබෙන සමාජ ප්‍රතිලාභ ප්‍රමාණය විශාලය. **(ලකුණු 02 යි)**

(iii) - අභිනව මුදල් වර්ෂය සඳහා ආණ්ඩුව විසින් සිදු කිරීමට අපේක්ෂා කරනු ලබන වියදම්, බදු අයකිරීම්, ණය ගැනීමේ සීමා සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කෙරෙන ලේඛනය විසර්ජන කෙටුම්පත ලෙස සැලකෙන අතර, ඒ සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලැබී පණතක් බවට පත්වූ විට එය **විසර්ජන පණත** නමින් හැඳින්වේ.

- විසර්ජන කෙටුම්පත මුදල් කෙටුම්පතක් වන අතර අදාළ මුදල් වර්ෂයේ වියදම් පියවා ගැනීමට ඒකාබද්ධ අරමුදලින් රජයට මුදල් ලබා දීම සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වේ. **(ලකුණු 02 යි)**

- කිසියම් අනපේක්ෂිත සිදුවීමක් හෝ මැතිවරණයක් පැවැත්වීම හෝ භාරකාර රජයක් පවතින විටක හෝ අභිනව මුදල් වර්ෂය සඳහා ඉදිරිපත් කිරීමට අපේක්ෂිත විසර්ජන කෙටුම්පත ඉදිරිපත් කිරීමට හැකියාවක් නොමැති අවස්ථාවන්හිදී, විසර්ජන කෙටුම්පතක් ඉදිරිපත් කරන තෙක් ආණ්ඩුවේ වියදම් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන



Visit EDUHUB

ඒකාබද්ධ අරමුදලෙන් ලබා ගැනීමට ඉදිරිපත් කරනු ලබන ලේඛනය අතුරු සම්මත ගිණුම ලෙස හැඳින්වේ.

- මේ මගින් මාස තුනේ සිට හතර දක්වා වූ කෙටි කාලයකට ආණ්ඩුවේ වියදම් පියවා ගැනීම සඳහා ඒකාබද්ධ අරමුදලෙන් මුදල් ලබා ගැනීමට පාර්ලිමේන්තුවේ අනුමැතිය අපේක්ෂා කෙරේ. මෙහි ඇතුළත් වන්නේ වියදම් ශීර්ෂ පමණක් වන අතර අයභාරය උපයා ගැනීම් යෝජනා කිසිවක් ඇතුළත් නොවේ. (ලකුණු 02 යි)

(iv) බදු නොවන අයභාර මූලාශ්‍ර :
- පොලී
- බදු කුලී
- රාජ්‍ය ව්‍යවසායන්ගේ ලාභ හා ලාභාංශ
- මහ බැංකුවේ ලාභ පැවරුම්
- අලෙවි කිරීම් හා ගාස්තු අයකිරීම්
- සමාජ ආරක්ෂණ දායක මුදල්


(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු හතරකට ලකුණු 04 යි)

(v) - කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් නිෂ්පාදනය කිරීමේදී සෘණ බාහිරතා හටගන්නා විට නිදහස් වෙළෙඳපොළක් තුළ කටයුතු කරන නිෂ්පාදන ආයතනයක් එම බාහිර පිරිවැය සැලකිල්ලට නොගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් අධි නිෂ්පාදනයක් සිදුවේ.

- නිෂ්පාදන ක්‍රියාවලියේදී බාහිර පිරිවැයක් පවතී නම් සමාජ පිරිවැය පෞද්ගලික පිරිවැය ඉක්මවා යයි. එහෙත් නිදහස් වෙළෙඳපොළක් තුළ නිෂ්පාදන තීරණ ගනු ලබන්නේ තනිකරම පෞද්ගලික ප්‍රතිලාභ සහ පෞද්ගලික පිරිවැය පමණක් පදනම් කර ගනිමිනි. එහි ප්‍රතිඵල වශයෙන් සමාජයීය වශයෙන් අවශ්‍ය කරන ප්‍රමාණයට වඩා වැඩි භාණ්ඩ ප්‍රමාණයක් (අධි නිෂ්පාදනයක්) බිහි කෙරේ.

(ලකුණු 02 යි)

- මෙම තත්ත්වය ඉල්ලුම් - සැපයුම් රූප සටහනක් මගින් පැහැදිලි කළ හැකිය.




- සෘණ බාහිරතාව නිසා හටගන්නා බාහිර පිරිවැය MPC සහ MSC සැපයුම් වක්‍ර අතර පවතින සිරස් දුර පෙන්නුම් කරයි. බාහිර පිරිවැය නොසලකා නිෂ්පාදන තීරණ ගන්නා විට ආයතනය $OQ_1$ ප්‍රමාණය නිපදවයි. බාහිර පිරිවැය සැලකිල්ලට ගත්විට සමාජයීය වශයෙන් ප්‍රශස්ත නිමැවුම් ප්‍රමාණය $Q_2$ ය. එබැවින් $Q_1$ සහ $Q_2$ අතර ප්‍රමාණය අධි නිෂ්පාදනය පිළිබිඹු කරයි.

(රූප සටහන පැහැදිලි කිරීමට ලකුණු 01 යි. නිවැරදි රූප සටහනට ලකුණු 02 යි)



Visit EDUHUB

**08 වන ප්‍රශ්නය**

**8.** (i) සාපේක්ෂ වාසිය සහ තරඟකාරිත්ව වාසිය අතර වෙනස පෙන්වා දෙන්න. (ලකුණු 04යි)

(ii) අපනයන ඉපයුම්වල ශීඝ්‍ර වර්ධනයක් අත්කර ගැනීමෙහි ලා ශ්‍රී ලංකාව මුහුණ දෙන ප්‍රධාන බාධක කවරේ ද? (ලකුණු 05යි)

(iii) නිල සංචිත වත්කම් යනුවෙන් අදහස් වන්නේ කුමක් ද? ඒවායේ ප්‍රධාන සංරචක නම් කරන්න. (ලකුණු 05යි)

(iv) කිසියම් භාණ්ඩයක් නිෂ්පාදනයේ දී නිරපේක්ෂ වාසියකින් තොරව සාපේක්ෂ වාසියක් ඇතිවිය හැකි ද? සංඛ්‍යාත්මක උදාහරණයක් ඇසුරින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

08. (i) - සාපේක්ෂ වාසියක් යනුවෙන් අදහස් කරනුයේ කිසියම් රටකට තවත් රටකට වඩා අඩු ආවස්ථික පිරිවැයකින් භාණ්ඩයක් හෝ සේවාවක් හෝ නිෂ්පාදනය කිරීමේ හැකියාවයි. කිසියම් රටක් සියලුම භාණ්ඩ අනික් රටට වඩා කාර්යක්ෂම ලෙස නිෂ්පාදනය කළ හැකි වුවද සාපේක්ෂ වාසි මත වෙළෙඳාමට සහභාගිවීමෙන් රටවල් දෙකටම ප්‍රතිලාභ ලබාගත හැකිය. **(ලකුණු 01 යි)**

- සාපේක්ෂ වාසි බිහි කෙරෙන ප්‍රධාන මූලාශ්‍රය වනුයේ භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය සහ ව්‍යවසායකත්වය වැනි එම රට සතු සම්පත් සම්භාරයයි. මීට අතිරේකව වැඩෙන පරිමාණානුකූල ඵල පොලී අනුපාතිකය විනිමය අනුපාතිකය වැනි සාධක ද සාපේක්ෂ වාසිවලට හේතු වේ. **(ලකුණු 01 යි)**

- තරඟකාරීත්ව වාසිය යනු ව්‍යාපාරයකට සිය තරඟකරුවන් අභිබව යාමට හැකියාව ලබා දෙන මෙවලමක් ලෙස එක් අතකින් සැලකිය හැකිය. ගනුදෙනුකරුවන්ට වඩා යහපත් සහ ඉහළ වටිනාකමක් ලබාදීමෙන් මෙම වාසිය අත්කර ගත හැකිය. තරඟකාරීත්ව වාසියක් ඇතිවිට තම තරඟකරුවන් ලබා දෙන ප්‍රතිලාභ හා සමානවූම ප්‍රතිලාභ ඊට වඩා අඩු පිරිවැයකින් (පිරිවැය වාසිය) ලබා දිය හැකිය. එසේ නැතහොත් ඉහළ මිලක් වුවත් අය කරමින් එය සාධාරණය වන පරිදි තරඟකරුවන් ලබා දෙන ප්‍රතිලාභ හා සේවාවන්ට වඩා විශාල හා උසස් ප්‍රතිලාභ ප්‍රමාණයක් ලබාදීමෙන්ද තරඟකාරීත්ව වාසිය (ප්‍රභේදන වාසිය) අත්කර ගත හැකිය. ව්‍යාපාරික ආයතනයකට මෙන්ම සමස්ත ආර්ථිකයක් සඳහා ද මෙම සංකල්පය යොදා ගත හැකිය. තරඟකාරීත්ව වාසි සංකල්පය පදනම් කරගෙන ඇත්තේ ශක්තිමත් ආර්ථිකයක් බිහිකර ගැනීම පිණිස ලාභ ශ්‍රමය සහ ස්වාභාවික සම්පත් අවශ්‍ය නොවේය යන අදහසයි. ජාතියේ සෞභාග්‍යය නිර්මාණය කරගත යුතු එකක් මිස උරුම වන්නක් නොවේ. සම්භාව්‍ය ආර්ථික විද්‍යාඥයින් දක්වන පරිදි එය එම රට සතු ලාභ ශ්‍රම හමුදා සංචිතයෙන්වත් ස්වාභාවික සම්පත් සම්භාරයෙන්වත් පොලී අනුපාතිකයන්ගෙන්වත් බිහි වන්නක් නොවේ. **(ලකුණු 01 යි)**

- තරඟකාරීත්ව වාසි බිහිකරන මූලාශ්‍රය වනුයේ එම රටේ කර්මාන්තවලට නව්‍යතාවන් බිහිකිරීමට ඇති හැකියාවය. ඉහළ ඵලදායිතාව, කාර්යක්ෂම ලෙස තාක්ෂණය භාවිත කිරීම, අඩු පිරිවැයකින් යෙදවුම් මිලදී ගැනීමට හැකි ලෙස කේවෙල් කිරීමේ ශක්තිය, වඩා කාර්යක්ෂම බෙදාහැරීමේ ජාලයන්ට ප්‍රවේශ වීම, ගුණාත්මක තත්ත්වයේ ඉහළ නිෂ්පාදන බිහි කිරීම, සන්නම් සඳහා යොමු වීම, බුද්ධිමය දේපළ හිමිකර ගැනීම තරඟකාරීත් වාසි ගෙන දෙන වැදගත් මූලාශ්‍රයෝය. **(ලකුණු 01 යි)**



Visit EDUHUB

(ii) - අපනයන නිෂ්පාදිතයන්ගේ විවිධාංගකරණය අතිශයින් සීමිත වීම. 1990 ගණන් මැද භාගයේ සිටම අප රටේ අපනයන සංයුතිය බොහෝ සෙයින් ස්ථාවරය පැවත තිබේ. ඇඟලුම්, තේ, රබර් වැනි සාම්ප්‍රදායික නිෂ්පාදිත කීපයකින් ඔබ්බට විවිධාංගකරණය කොට නොමැත.

- අපනයන වෙළෙඳපොළවල විවිධාංගකරණයක් දක්නට නොතිබීම : මුළු අපනයන වලින් 2/3 ක් පමණ යොමුව ඇත්තේ යුරෝපය සහ ඇමෙරිකා එක්සත් ජනපදය වෙතය. තවද තේ අපනයන වලින් 70% ක් පමණ යොමුව ඇත්තේ මැද පෙරදිගට සහ ස්වාධීන රාජ්‍ය පොදු රාජ්‍ය මණ්ඩලයටය.

- අපනයනාභිමුඛ කර්මාන්ත සඳහා ආයෝජනය සීමිත වීම : නැගෙනහිර ආසියාවේ නව කාර්මික රටවල අපනයන අංශයේ ශීඝ්‍ර වර්ධනයට දායක වූයේ අපනයනාභිමුඛ සෘජු විදේශ ආයෝජනයන්ය. එහෙත් ශ්‍රී ලංකාව සෘජු විදේශ ආයෝජන මෙම ක්ෂේත්‍රයට යොමු කරවා ගැනීමට අසමත්ව ඇත.

- සරල තාක්ෂණය මත පදනම් වූ අපනයන කර්මාන්තය : අප රටේ ඇත්තේ ඉතා පහළ මට්ටමේ තාක්ෂණය හා ශිල්පඥානය පදනම් කරගත් අපනයන කර්මාන්තයන්ය. බටහිර රටවල් එවැනි තාක්ෂණය අත්හැර දමා ඉහළ තාක්ෂණය කරා යොමු වන විට ශ්‍රී ලංකාව තව දුරටත් එවැනි සරල තාක්ෂණයන්හිම එල්බ සිටී.

- වර්තමානයේ ප්‍රධාන අපනයන කර්මාන්ත ඵලදායිතාව ඉහළ යාමට වඩා වැඩි වේගයකින් සිදුවන වැටුප් ඉහළ යාමේ ගැටලුවද මුහුණ දී සිටී.

- තේ අපනයන ක්ෂේත්‍රයේ ඵලදායිතාව අඩු වීම සහ පිරිවැය ඉහළ යාම : ශ්‍රම සූක්ෂම තාක්ෂණය පදනම් කරගත් නිෂ්පාදන ක්‍රියාවලියේ පිරිවැය ඉතා අධිකය. පැරණි තේ ගස් අඩුඵලදාවක් ලබා දෙයි. තරගකාරී රටවල් සමග සසඳන විට ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනයේ පිරිවැය ඉහළ යාම ප්‍රධාන ගැටලුවකි.

- ශ්‍රම හමුදාව අඩුවීම සහ ශ්‍රම පිරිවැය ඉහළ යාම : තේ වතුවලට අවශ්‍ය කරන ශ්‍රමය රඳවා ගැනීම විශාල අභියෝගයක් වී ඇත. තේ කම්කරුවන්ගේ අඩු සමාජ තත්ත්වය, තරුණ පරපුර අධ්‍යාපනය ඉහළ නංවා ගැනීම නිසා වතු අංශයට යොමු නොවීම, තේ වතු වලින් පරිබාහිරව වඩා ආකර්ශණීය රැකියා අවස්ථා පැවැතීම මෙහිලා බලපා ඇත.

**(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු පහකට ලකුණු 05 යි)**

(iii) - නිල සංචිත වත්කම් යනුවෙන් අදහස් කරනුයේ ජාත්‍යන්තර ගෙවීම් මාධ්‍යයන් වශයෙන් යොදා ගත හැකි මූල්‍ය වත්කම්ය. **(ලකුණු 02 යි)**

- නිල සංචිත වත්කම්වලට පහත සඳහන් දෑ ඇතුළත් වේ.
  - මූල්‍ය රන්
  - විදේශ විනිමය
  - විශේෂ ගැනුම් හිමිකම්
  - ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සංචිත තත්ත්වය
  - විදේශ ව්‍යවහාර මුදල් ණය
  - විදේශ ව්‍යවහාර මුදලින් නිකුත් කළ අලෙවි කළ හැකි සුරැකුම් පත්

**(එක් කරුණකට ලකුණු 01 බැගින් අයිතම තුනකට ලකුණු 03 යි)**



Visit EDUHUB

(iv) - නිරපේක්ෂ වාසියක් යනුවෙන් මෙහිදී අදහස් කෙරෙනුයේ කිසියම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමේදී එක් රටකට අනිත් රටට වඩා ඉහළ ඵලදායිතාවක් සහිතව හෝ අඩු පිරිවැයක් සහිතව නිෂ්පාදනය කිරීමේ හැකියාවයි.
එහෙත් වෙළෙඳාමෙන් අන්‍යෝන්‍ය ප්‍රතිලාභ ලැබීම සඳහා භාණ්ඩ නිෂ්පාදනයේදී නිරපේක්ෂ වාසි තිබීම අවශ්‍ය නොවන අතර එය ප්‍රමාණවත් ද නොවේ.

(ලකුණු 01 යි)

- උදාහරණයක් වශයෙන් කිසියම් රටකට තවත් රටක් සමග සංසන්දනය කිරීමේදී සෑම භාණ්ඩයක්ම නිෂ්පාදනයෙහිලා නිරපේක්ෂ අවාසියක් තිබිය හැකිය. එසේ තිබියදීත් එම රටට අනික් රට සමග ජාත්‍යන්තරව වෙළෙඳාමේ යෙදීමටත් දෙරටටම ප්‍රතිලාභ ලබා ගැනීමටත් හැකියාව ඇත. එසේ විය හැක්කේ ඇතැම් භාණ්ඩ නිෂ්පාදනයේදී එක් රටකට අනික් රට හා සසඳන විට සාපේක්ෂ වාසියක් ඇත්නම් ය.

- සාපේක්ෂ වාසියක් ඇති වීම සඳහා නිරපේක්ෂ වාසි තිබීම අත්‍යවශ්‍ය නොවේ. නිරපේක්ෂ වාසියක් නොමැතිවම (එනම් නිරපේක්ෂ අවාසියක් සහිත) කිසියම් රටකට සාපේක්ෂ වාසියක් හිමිකර ගත හැකිය. (ලකුණු 01 යි)

- සංඛ්‍යාත්මක උදාහරණය :
සතියක ශ්‍රමය යොදා ගනිමින් ඉන්දියාව හා ශ්‍රී ලංකාව ඇඟළුම් සහ බයිසිකල් නිෂ්පාදනය කරන විට නිෂ්පාදනය කළ හැකි ඒකක ප්‍රමාණ වගුවෙහි දක්වේ.

| භාණ්ඩය | ඉන්දියාව | ශ්‍රී ලංකාව |
|---|---|---|
| ඇඟැලුම් (ඒකක) | 12 | 8 |
| බයිසිකල් (ඒකක) | 6 | 2 |

(නිවැරදි සංඛ්‍යාත්මක උදාහරණයට ලකුණු 02 යි)

- මෙහි දක්වෙන ආකාරයට කිසිදු භාණ්ඩයක් සම්බන්ධව ශ්‍රී ලංකාවට නිරපේක්ෂ වාසියක් නැත. ඇඟලුම් හා බයිසිකල් යන භාණ්ඩ දෙකම පිළිබඳ ඉහළම ඵලදාව හෙවත් නිරපේක්ෂ වාසිය ඇත්තේ ඉන්දියාවටය. ශ්‍රී ලංකාවට භාණ්ඩ දෙකම සඳහා නිරපේක්ෂ අවාසියක් ඇත. එසේ තිබියදීත් ශ්‍රී ලංකාවට නිෂ්පාදනයේදී සාපේක්ෂ වාසියක් අත්කර ගත හැකිය. ඇඟැලුම් ඒකකයක් නිෂ්පාදනය කිරීමේ ආවස්ථික පිරිවැය ඉන්දියාවේ බයිසිකල් ඒකක 1/2 (= 0.5) කි. ශ්‍රී ලංකාවේ එය 1/4 ක් හෙවත් 0.25 කි. ඇඟැලුම් නිෂ්පාදනය පිළිබඳ සාපේක්ෂ වාසිය ඇත්තේ ශ්‍රී ලංකාවටය. එබැවින් ශ්‍රී ලංකාවට වෙළෙඳාමේ යෙදීමෙන් වාසි අත්කර ගත හැකිය.

(ආවස්ථික පිරිවැය නිවැරදිව ගණනය කිරීමට ලකුණු 02 යි)



Visit EDUHUB

**09 වන ප්‍රශ්නය**

9. (i) ආර්ථික වෘද්ධියේ ප්‍රධාන මූලාශ්‍ර සඳහන් කරන්න. (ලකුණු 04යි)

(ii) සංවර්ධනය මැනීමෙහි ලා මානව සංවර්ධන දර්ශකයෙහි දක්නට ඇති ප්‍රධාන සීමාකම් කවරේ ද? (ලකුණු 05යි)

(iii) "ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව අඩුකිරීම සඳහා සමෘද්ධි වැඩ සටහනෙන් කරනු ලැබ ඇති බලපෑම නොවැදගත් සහ දුබල වූවකි." ලෝක බැංකුවේ මෙම ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නේ ද? හේතු දක්වන්න. (ලකුණු 05යි)

(iv) ශ්‍රී ලංකාවේ වයස්ගත ජනගහනය සඳහා ඇති සමාජ ආරක්ෂණ ජාලයට ප්‍රජාවිද්‍යාත්මක වෙනස්කම් මගින් එල්ලකරනු ලැබ ඇති නව අභියෝග කවරේ දැයි විස්තර කරන්න. (ලකුණු 06යි)

09. (i) - සම්පත් සම්භාරය : ස්වාභාවික ප්‍රාග්ධනය, භෞතික ප්‍රාග්ධනය, මානව ප්‍රාග්ධනය සහ සමාජ ප්‍රාග්ධනය

- ඵලදායිතාව : තාක්ෂණය උසස් වීම, නව්‍යතා බිහිවීම, පර්යේෂණ හා සංවර්ධනය සඳහා ආයෝජනය ඉහළ නැංවීම, කළමනාකාරීත්වය උසස් වීම.

- ආර්ථික ස්ථාවරත්වය (හිතකර මූලික සාර්ව ආර්ථික කොන්දේසි දක්නට ලැබීම.)

- යහපත් ව්‍යාපාරික පරිසරය : යටිතල පහසුකම්, මූල්‍ය හා බැංකු පද්ධතිය කාර්යක්ෂම වීම, වෙළෙඳපොළ කාර්යක්ෂම වීම, වෙළෙඳපොළ සානුබල පැවැතීම, ආයතන වල ඵලදායිතාව කෙරෙහි බලපාන බදු සහ නියාමනයන්ගේ කාර්යක්ෂමතාව

- වෙළෙඳාමට සහ ආයෝජනයට විවෘත වීම.

- අධ්‍යාපන පද්ධතියේ කාර්යක්ෂමතාව හා අදාළත්වය

- දේශපාලන ස්ථාවරත්වය හා හිංසනයන් නොමැති වීම.

- යහපාලනය : වගවීම, නීතියේ ආධිපත්‍යය, ආණ්ඩුවේ කාර්යක්ෂමතාව, දූෂණය මර්දනය කිරීම.

- ව්‍යවසායකත්ව හැකියාවන්

**(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු හතරකට ලකුණු 04 යි)**

(ii) - මානව සංවර්ධන දර්ශකය සමාහාර (aggregate) මිනුමක් වන බැවින් රට අභ්‍යන්තරයේ දැකිය හැකි සංවර්ධන විෂමතා (ආදායම් විෂමතා, ප්‍රාදේශීය සංවර්ධිත විෂමතා, ජනවාර්ගික විෂමතා යනාදිය) මේ මගින් පිළිබිඹු නොකෙරේ.

- මානව සංවර්ධනයේ සියළු පැතිකඩ මේ යටතේ ආවරණය නොවේ. උදා : ජන සහභාගිත්වය, දේශපාලන නිදහස, මානව සුරක්ෂිතතාව (human security)

- දර්ශකය තුළ ඇති ප්‍රධාන සංරචක තුනට එක හා සමාන බර තැබීමක් ලබා දී ඇත. එලෙස එක හා සමාන වූ වැදගත්කමක් ලබා දීම තාර්කික නොවේයයි විවේචකයෝ පවසති.



Visit EDUHUB

- සංවර්ධනය යන්නෙන් පුළුල් වශයෙන් අදහස් වන්නේ අවශ්‍යතාවන්ගෙන් නිදහස් වීමය. එහෙත් මෙම කරුණ මානව සංවර්ධන දර්ශකයෙන් ඍජුව මැනෙන්නේ නැත. උදාහරණයක් වශයෙන් අන්තර්ජාලයට ප්‍රවේශවීමට ඇති හැකියාව බොහෝ දෙනෙක් තම නිදහස සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය කරුණක් ලෙස සලකති. එමගින් මිනිසුන්ගේ ජීවිතයේ ගුණාත්මක තත්ත්වය උසස් කෙරෙන බැවිනි.

- ජීවන තත්ත්වය මනින පටු මිනුමක් ලෙස ප්‍රතිශීර්ෂ ආදායම යොදා ගනු ලැබුවද ආදායම් ව්‍යාප්තිය පිළිබඳ කිසිදු අවධානයක් යොමු නොකරයි.

- ගුණාත්මක වෙනස්කම් සැලකිල්ලට නොගැනේ.
  උදා : පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක තත්ත්වය, සෞඛ්‍ය සේවාවන්ගේ ගුණාත්මක තත්ත්වය

- අධ්‍යාපනය මිනුම් කිරීමේදී ප්‍රාථමික අධ්‍යාපනයට ආරම්භයේදී යොමු වූ ශිෂ්‍ය සංඛ්‍යාව පමණක් සැලකිල්ලට ගනී. එහෙත් අතරමගදී පාසල් හැර යන ප්‍රමාණය සැලකිල්ලට නොගනී.

- මානව හිමිකම් දර්ශකය වෙනස් කිරීමට එහි ඇතුළත් ප්‍රධාන සංරචක තුන සාපේක්ෂව කරනු ලබන බලපෑම මේ දර්ශකයෙන් හෙළි නොවේ. කිසියම් රටක දර්ශකය කාලයත් සමග වෙනස් වන විට එහිලා මෙම සංරචක සාපේක්ෂ වශයෙන් කරනු ලබන බලපෑම දැනගත නොහැකිය. උදාහරණ වශයෙන් එකී වෙනසට හේතුවූයේ ප්‍රතිශීර්ෂ ආදායමේ හටගත් වෙනස් වීමක් ද නැතහොත් වැඩිහිටි සාක්ෂරතාවේ වෙනස්වීමක් නිසාද වශයෙන් දැන ගැනීම අපහසු ය.

- සංවර්ධනය කෙරෙහි බලපාන පාරිසරික පැතිකඩ මේ සඳහා සැලකිල්ලට නොගැනේ.

**(එක් කරුණකට ලකුණ 01 බැගින් ඕනෑම කරුණු පහකට ලකුණු 05 යි)**

(iii) - 1995 දී ආරම්භ කරන ලද සමෘද්ධි වැඩසටහනෙහි ප්‍රධාන අභිලාශය වූයේ ජනතා සහභාගීත්ව සංවර්ධන ක්‍රියාවලියක් ඔස්සේ ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව පහළ හෙළීමය.

- සමෘද්ධි වැඩසටහනෙහි ප්‍රධාන සංරචක වූයේ දිළින්දන් ලෙස හඳුනාගත් කුටුම්බ සඳහා ආහාර මුද්දර ලබා දීම, සමෘද්ධි බැංකු ඔස්සේ ක්‍රියාත්මක වන ඉතුරුම් හා ණය ලබාදීමේ වැඩසටහන සහ ප්‍රජා යටිතල පහසුකම් පුනරුත්ථාපනය සහ සංවර්ධනයයි.

- මෑතකදී ලෝක බැංකුව විසින් සමෘද්ධි වැඩසටහන පිළිබඳ සිදු කරන ලද අධ්‍යයනයන් මගින් හෙළි කරනු ලැබුවේ එය කාර්යක්ෂම සංක්‍රාම වැඩසටහනක් නොවන බවය. අපේක්ෂිත ප්‍රතිලාභීන් කරා ළංවීමේදී එය පෙන්වා ඇත්තේ ඉතා සීමිත සාර්ථකත්වයකි. එහෙත් තම සම්පත් වලින් විශාල පංගුවක් දිළිඳු නොවන පුද්ගලයන් කරා ගලා යන බව පෙන්වා දුන්නේය.

- සමෘද්ධි සංක්‍රාම අතිශයින් කුඩා ප්‍රමාණයක් වන බැවින් දිළිඳු කුටුම්බවල අය වැය මත සැලකිය යුතු බලපෑමක් කිරීමට අසමත් වීම. 2012/13 වර්ෂයේදී සමෘද්ධි සංක්‍රාම දායක වූයේ ජනගහනයේ දිළිඳුතම 20% කි. කුටුම්බ පරිභෝජනයෙන් 1.7% ක්ම පමණි.



Visit EDUHUB

- සමෘද්ධි වැඩසටහනේ අයවැය ලේඛනයෙන් 80% ක් වෙන්ව ඇත්තේ ආහාර මුද්දර වැඩ සටහනටය. 2007 වර්ෂයේදී CEPA ආයතනය කරන ලද අධීක්ෂණයකින් පෙන්වා දී තිබුනේ දිළිඳු ජනගහන පංචමකයේ සිටින පුද්ගලයන්ගෙන් 40% කට සමෘද්ධි සහන නොලැබෙන බවද, අනික් අතට සමෘද්ධි අයවැයෙන් 44% ක් ගලාගොස් තිබෙන්නේ ඉහළම ආදායම් සහිත පංචමකයන් තුනටය. සෑම ආදායම් දශමකයකම සිටින කුටුම්බ සැලකිය යුතු ප්‍රතිශතයක් සමෘද්ධි ප්‍රතිලාභ උපයන බව ඔවුන් තරදුරටත් පෙන්වා දුන්හ. සමෘද්ධි සංවර්ධන නිලධාරීන් වැනි පහළම මට්ටමේ සිටින නිලධාරීන් බොහෝ විට ප්‍රතිලාභ ඉලක්කගත නොවීම කෙරෙහි වග කිව යුතු වේ.

- ප්‍රාදේශීය දේශපාලන නායකත්වයද බොහෝ දුරට මෙහිලා වග කිව යුතු වේ.

- වැඩසටහනට ප්‍රවේශවීමට හා ඉවත් වීමට අදාළ නිර්ණායක නිශ්චිතව හඳුනාගෙගන නොමැත.

**(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 05 යි)**

(iv) - ශ්‍රී ලංකාව වර්තමානයේ මුහුණ පා සිටින ප්‍රජා විද්‍යාත්මක සංක්‍රාන්තිය අති විශේෂ වූවකි. ජනගහනය වියපත්වීම ලෝකය පුරාම දැකිය හැකි සාමාන්‍ය තත්ත්වයක් වුවද ශ්‍රී ලංකාවේ එහි ස්වරූපය බරපතළ ස්වභාවයක් පෙන්නුම් කරයි. සංවර්ධිත නොවන රටවල් අතර වැඩිම වියපත් ජනගහනය හිමි රට බවට ශ්‍රී ලංකාව පත්ව ඇති අතර ලෝකය සමස්තයක් වශයෙන් ගත් විටද ඉතා වේගයෙන් ජනගහනය වියපත් භාවයට පත්වන රටවල් අතර ප්‍රධාන ස්ථානයක් ශ්‍රී ලංකාව හිමිකර ගනී. වර්ෂ 2000 දී වයස අවුරුදු 60 ට වැඩි ජනගහන ප්‍රතිශතය 9.2% ක් පමණක් වුවද 2050 වන විට එය 30% දක්වා ඉහළ නගින බව ඇස්තමේන්තු කොට ඇත.

- වේගයෙන් වියපත් භාවයට පත්වන ජනගහනය රැක බලා ගැනීමට පවත්නා ඉතුරුම් හා විශ්‍රාම වැටුප් ක්‍රමයක්ද ආයතනික සහාය ද ප්‍රමාණවත් නොවේ.

**(ලකුණු 01 යි)**

- රාජ්‍ය සේවකයන් විශ්‍රාම වැටුප් ක්‍රමය සාපේක්ෂ වශයෙන් යහපත් එකක් වුවද ඉදිරි වර්ෂවල දී මේ සඳහා රජයට දැරීමට සිදුවන පිරිවැය ඉතා විශාල වෙතින් අපේක්ෂා කෙරේ. වර්තමානයේ විශ්‍රාම වැටුප් සඳහා දළ දේශීය නිෂ්පාදිතයෙන් 1.4% ක් පමණ මුදලක් වැඩිවන අතර දිගුකාලයේ දී මෙය මෙලෙසම පවත්වාගෙන යාමට හැකියාවක් තිබේද යන්න ප්‍රශ්න කටයුතුය. **(ලකුණු 01 යි)**

- ශ්‍රම හමුදාවෙන් 1/3 ක් පමණ ආවරණය කෙරෙන විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ රැකවරණය සඳහා ඇත්තේ අර්ථසාධක අරමුදල පමණි. විශ්‍රාම ගිය පසුව ප්‍රමාණවත් රැකවරණයක් මෙම අරමුදලින් සැපයෙනවාද යන්න සැක සහිතය. අවුරුදු 55 දී විශ්‍රාම ගියද වයස අවුරුදු 80 පමණ වනතෙක් ජීවත් වන පුද්ගලයෙකුට මෙම අරමුදලෙන් ලැබෙන ප්‍රතිලාභය ඉතා සීමිතය. **(ලකුණු 01 යි)**

- මීට අමතර වැඩිහිටි දීමනා වශයෙන් ආධාර මුදලක් වයස අවුරුදු 70ට වැඩි පුද්ගලයන්ට රජය ලබාදේ. මාසයකට රුපියල් 2000ක් වන මෙම ආධාර මුදල ලබන පිරිස 400,000 පමණ වන නමුදු එවැනි මුදලක් ලබා ගැනීමට තවත් විශාල පිරිසක් පොරොත්තු ලේඛනවල සිටිති. **(ලකුණු 01 යි)**



Visit EDUHUB

- ශ්‍රී ලංකාවේ මනා සෞඛ්‍ය සේවා පද්ධතියක් දක්නට ලැබුණද වියපත් ජනගහනයේ සෞඛ්‍ය අවශ්‍යතා සඳහා ඒවා යෝග්‍ය ලෙස සකස් වී තිබේද යන්න ගැටලුවකි. විශේෂයෙන් බෝ නොවන රෝග සඳහා ප්‍රතිකාර ලබා ගැනීමත් දිගුකාලීනව රැක බලා ගැනීමත් සඳහා පහසුකම් අවශ්‍ය වනු ඇත. (ලකුණු 01 යි)

- වියපත් ජනගහනය රැක ගැනීම සඳහා දැනට පවතින ප්‍රධාන ආයතනික ව්‍යුහය වන්නේ පවුල් ඒකකයයි. විශේෂයෙන් කාන්තාවන් මත මේ බර පතිත වී ඇත. රැකියාවක යෙදෙමින් තම දරුවනුත් දෙමාපියනුත් රැක බලා ගැනීම ඉතා අභියෝගාත්මක කාර්යයකි.

- දරුවන්ට තම දෙමාපියන් රැක බලා ගැනීමට සිදුවීම නිසා විශේෂයෙන් දියණිවරුන්ට රැකියාවක යෙදීමට ඇති අවස්ථා මග හැරී ඇත. එය විශාල ආවස්ථික පිරිවැයකි. එබැවින් ප්‍රජාව තුළින්ම වැඩිහිටියන් රැක බලා ගැනීම සඳහා අඩු පිරිවැය සහිත ආයතනික වැඩ පිළිවෙළක් සකසා ගැනීම වැදගත්ය. තවද කිසිදු ආදායමක් නොමැති වියපත් පුද්ගලයන් රැකබලා ගැනීම සඳහා සමාජ ආරක්ෂණ ජාලයක් ඇති කිරීම රජයේ වගකීමක් ද වේ. (ලකුණු 01 යි)

(මුළු ලකුණු 06 යි)

## 10 වන ප්‍රශ්නය

**10.** (i) සිව්වන කාර්මික විප්ලවය (4IR) යනු කුමක් ද? ඒ සඳහා මුහුණ දීමට ශ්‍රී ලංකාව සූදානම් ද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

(ii) ශ්‍රී ලංකාව මත කෝවිඩ් -19 වසංගතය සිදුකොට ඇති ආර්ථික බලපෑම සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 05යි)

(iii) "දීර්ඝ කාලයක් පුරාවට ඉහළ ආර්ථික වෘද්ධි අනුපාතිකයක් පවත්වා ගෙන යාමට ශ්‍රී ලංකාව අපොහොසත්ව සිටී." මෙම ප්‍රකාශය තහවුරු කර ශ්‍රී ලංකා ආර්ථිකයේ ඌන සාධනයට බලපා ඇති හේතු සඳහන් කරන්න. (ලකුණු 05යි)

(iv) "නිදහසින් පසු ශ්‍රී ලංකාවේ සංවර්ධන අත්දැකීම් පැහැදිලිව පෙන්වා දෙනුයේ, ආර්ථික ප්‍රතිපත්ති තීරණය කරනු ලැබ ඇත්තේ බොහෝ දුරට කාර්යක්ෂමතාව මත පදනම්ව නොව දෘෂ්ටිවාදයන් මත පදනම්ව යෑ" නිදසුන් සහිතව මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

10. (i) - අන්තර්ජාලීය දේවල් (Internet of Things), රොබෝ විද්‍යාව, අතථ්‍ය යථාර්ථය (Virtual Reality), 3D මුද්‍රණය, කෘත්‍රිම බුද්ධිය (Artificial Intelligence), කඩාකප්පල්කාරී තාක්ෂණය (Disruptive Technologies), වැනි ප්‍රවණතා ඔස්සේ අපගේ ජනජීවිතය හා වැඩ ලෝකය පිළිබඳව වර්තමානයේ සිදුවෙමින් බවත්නා සීඝ්‍ර වෙනස්කම් සිව්වන කාර්මික විප්ලවය (4IR) ලෙස හඳුන්වනු ලැබේ. (ලකුණු 01 යි)

- නවීන පන්නයේ ජීවන රටාවකට නැතිවම බැරි දේවල් බවට සීඝ්‍රයෙන් පත්වෙමින් පවත්නා බොහෝ භාණ්ඩ හා සේවා බිහිව ඇත්තේ මෙම සිව්වන කාර්මික විප්ලවයේ ප්‍රතිඵල වශයෙනි. උදාහරණ වශයෙන් පෘථිවියේ කිසියම් ස්ථානයකට ඉක්මනින්ම ළඟාවිය හැකි මාර්ගය හා ක්‍රමය පෙන්වා දෙන GPS පද්ධතිය (Global Positioning System) 'ඇපල්' උපකරණයන්හි දක්නට ලැබෙන 'සිරි' (Siri) නැමැති අතථ්‍ය සහායකයා, මුහුණු පොතට ඔබගේ මුහුණ හඳුනාගැනීමේ හැකියාව සහ මිත්‍රයෙකුගේ පින්තූරයට ඔබගේ ඡායාරූපය Tag කිරීමේ හැකියාව, Netflix සඳහා ඔබගේ



Visit EDUHUB

පෞද්ගලිකවරණ නිර්දේශ කිරීම වැනි දෑ එදිනෙදා ජීවිතයේ සාමාන්‍ය අංශ බවට පත්ව ඇත.

- ආර්ථිකය, සමාජ ජීවිතය, සෞඛ්‍යය, අධ්‍යාපනය, ජීවන රටාව, රැකී රක්ෂා ස්වභාවය, නිපුණතා සංවර්ධනය වැනි සෑම ක්ෂේත්‍රයකම සුසමාදර්ශ විතැන් කිරීමක් (Paradigm Shift) මෙම විප්ලවය නිසා සිදුව ඇත. ඉහළ තාක්ෂණයත් සමග බැඳුණු ස්වයංක්‍රියකරණය හා රොබෝ විද්‍යාව මිනිස් ශ්‍රම හමුදාව ප්‍රතිස්ථාපනය (replacement) කරමින් පවතී. (ලකුණු 01 යි)

- දෛනික ජීවිතයේ ආර්ථික හා සමාජයීය පැතිකඩවලට නවීන තාක්ෂණය අන්තර්ග්‍රහණය කරගැනීමේලා හිතකර වාතාවරණයක් නිර්මාණය කර ගැනීමට ශ්‍රී ලංකාව සමත් වී නැත. එහිලා පවත්නා ව්‍යුහමය සහ ආයතනික ගැටලු හඳුනාගෙන ඒවා විසඳා ගැනීමට සාර්ථක ක්‍රියාමාර්ග ගත යුතුව ඇත.

- ශ්‍රී ලංකාව තවමත් කල් ගෙවනුයේ දෙවැනි කාර්මික විප්ලවය තුළය. එබැවින් සිව්වන කාර්මික විප්ලවයට ප්‍රවේශ වීමට විශාල පිම්මක් පැනිය යුතුව ඇත. ඉතා මූලික මට්ටමේදී සිව්වන කාර්මික විප්ලවයේ තාක්ෂණය බොහෝ සෙයින් පැන නගිනුයේ පරිගණක හා අන්තර්ජාලීය දේවල් (IOT) ආශ්‍රයෙනි. පහළ මට්ටමක පවත්නා පරිගණක සාක්ෂරතාව සහ අන්තර්ජාලයට ප්‍රවේශවීමට ඇති බාධා සැලකිල්ලට ගත්විට සිව්වන කාර්මික විප්ලවය තුළින් බිහිවන ඉහළ මට්ටමේ තාක්ෂණය අවශෝෂණය කරගැනීම සහ ක්‍රියාවට නැංවීම ශ්‍රී ලංකාවට ඉමහත් අභියෝගයකි. අන්තර්ජාලය භාවිත කරනුයේ ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 34% ක් පමණි. 2018 වර්ෂයේ දී අප රටේ පරිගණක සාක්ෂරතාව 22.9% ක් විය.

- තාක්ෂණික යටිතල පහසුකම් සුලබතාව සහ ඒවා භාවිතය පිළිබඳව පවත්නා විෂමතා බොහෝ දුරට ස්ත්‍රී පුරුෂ සමාජ භාවය සහ ප්‍රාදේශීය වෙනස්කම් හා බැඳී පවතී. අන්තර්ජාල භාවිතයේදී ස්ත්‍රී - පුරුෂ සමාජ තත්ත්වය මත පවත්නා වෙනස 40% ක් තරමය. තවද, ප්‍රාදේශීය වශයෙන් IT සාක්ෂරතාවේ දැඩි වෙනස්කම් පවතී. නාගරික අංශයේ සාක්ෂරතාව 36.9% ක් වුවද ග්‍රාමීය අංශයේ එය 22% කි. වතු අංශයේ 8.6% කි.

- සිව්වන කාර්මික විප්ලවයට යෝග්‍ය මානව ප්‍රාග්ධනය සූදානම් කරවීම ද ඉමහත් අභියෝගයකි. ඒ සඳහා ඉහළ නිපුණතා සහිත කඩිසර සහ බහු මුහුණුවර ශ්‍රම හමුදාවක් (Multi - faceted labour force) අවශ්‍ය කෙරේ. ශ්‍රී ලංකාව සාක්ෂරතාව අතින් ඉහළ මට්ටමක සිටියත් සිව්වන කාර්මික විප්ලවයේ මුලින්ම තර්ජනයට ලක්වනුයේ මූලික සාක්ෂරතාව සහ සංඛ්‍යාත්මක දැනුම පදනම් කරගත් රැකියා අවස්ථාවන්ය.

- වයස අවුරුදු 20 ට වැඩි ජනගහනයෙන් තම වෘත්තියට අදාළ වෘත්තීය හෝ තාක්ෂණික පුහුණුවක් ලබා ඇත්තේ 10% ක් පමණි. විශ්වවිද්‍යාලවල පවා තවමත් බහුතරයක් හදාරන්නේ ශාස්ත්‍රීය විෂයන්ය. විද්‍යා විෂයන් හදාරන්නේ සාපේක්ෂව අඩු පිරිසකි. සිවුවන කාර්මික විප්ලවයේදී අධ්‍යාපන ප්‍රමුඛතා ක්ෂේත්‍ර වනුයේ විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු විද්‍යාව හා ගණිතය (STEM) යන විෂයන්ය. මෙම විෂයන් පිළිබඳ පුහුණුව ලත් ගුරුවරුන් ද අප රටේ බොහෝ පාසල් වල නැත.



Visit EDUHUB

- ශ්‍රී ලංකාවේ නිෂ්පාදන කර්මාන්තවල මධ්‍යම හා ඉහළ අධි තාක්ෂණය ඔස්සේ බිහිකෙරෙන එකතු කළ අගය 6.7% ක් පමණි. අපේ නිෂ්පාදන කර්මාන්ත බොහෝමයක් රඳා සිටිනුයේ සිව්වන කාර්මික විප්ලවයේදී යල් පැනීමට ලක්වන තාක්ෂණයන් මතය. උදාහරණ වශයෙන් රෙදිපිළි සහ ඇඟළුම් කර්මාන්තය කඩාකප්පල්කාරී තාක්ෂණය කරනකොට ශ්‍රම ප්‍රතිස්ථාපන ගැටලුවට මුහුණදීමේ විභවතාවක් පවතී.

- ශ්‍රී ලංකාවේ සේවා අංශයේ වර්ධනය බොහෝ සෙයින් රඳා ඇත්තේ ප්‍රවාහනය හා වෙළෙඳාම වැනි වෙළෙඳ - නොවන (non - tradable) අංශ මතය. මෙතෙක් මෙම අංශ සීඝ්‍ර පරිවර්තනයකට මුහුණ පා නොසිටියත් නුදුරු අනාගතයේදී ඒ සඳහා මුහුණ පෑමට සිදුවනු ඇත. ස්වයං-රිය පැදවීමේ තාක්ෂණය ළඟා වූ විට ශ්‍රම වෙළෙඳපොළ තුළ දැඩි කම්පනයන් සිදුවිය හැකිය.

**(ඕනෑම ගැටලු තුනකට ලකුණු 01 බැගින් ලකුණු 03 යි)**

(ii) - රාජ්‍ය මූල්‍ය පීඩනයන්ට සහ පහළ වෘද්ධි අනුපාතිකයන්ට මුහුණ දෙමින් දැනටමත් අභියෝගාත්මක සාර්ව ආර්ථික වාතාවරණයක පසුවන ශ්‍රී ලංකා ආර්ථිකය කෝවිඩ්-19 වසංගතය නිසා තවදුරටත් දුබලවී ඇත. එම වසංගතය ශ්‍රී ලංකාව මත ඇති කෙරෙන බලපෑම ශ්‍රී ලංකාවේ තත්ත්වය මත පමණක් නොව ශ්‍රී ලංකාවේ තීරණාත්මක වෙළෙඳපොළවල් පිහිටි, ඇමෙරිකා එක්සත් ජනපදය, යුරෝපය සහ චීනයේ තත්ත්වය මත ද රඳා පවතී.

- මෙම වසංගතය ශ්‍රී ලංකාවේ අපනයන ඉපැයුම්, පෞද්ගලික පරිභෝජනය හා ආයෝජනය මත කරනු ලබන අයහපත් බලපෑම නිසා ආර්ථික වෘද්ධිය නිශේධනාත්මක තත්ත්වයකට පත් විය හැකිය. ආසියානු සංවර්ධන බැංකුවේ පුරෝකථනයන්ට අනුව 2020 දී ශ්‍රී ලංකාවේ ආර්ථිකය 5% කින් පමණ සංකෝචනය වනු ඇත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පුරෝකථනය කරනුයේ 4.5% කින් සංකෝචනය වන බවය.

- විදේශ විනිමය උපයා ගැනීම සඳහා අපනයන ඉපයුම් මත රඳා සිටින අසතුටුදායක ණයබර තත්ත්වයක් සහ රාජ්‍ය මූල්‍ය තත්ත්වයන් සහිත ශුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ආර්ථිකයේ කොඳුනාරටිය සේ ක්‍රියාකරන ශ්‍රී ලංකාව වැනි කුඩා රටවලට මෙම වසංගතය අතිශය බරපතළ ලෙස බලපානු ඇත.

- ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන වෙළෙඳපොළවල් දක්නට ලැබෙන්නේ යුරෝපා සංගමය, මහා බ්‍රිතාන්‍යය හා ඇමෙරිකා එක්සත් ජනපදයේය. එබැවින් ගෝලීය ආර්ථික පසුබෑම ශ්‍රී ලංකාවේ අපනයන ඉල්ලුමට ඉතා අහිතකර ලෙස බලපානු ඇත.

- ශ්‍රී ලංකාවේ සෘජු විදේශ ආයෝජන ප්‍රභවස්ථාන රටක් ලෙස චීනය මුහුණපා ඇති ආර්ථික පසුබෑම අප රටේ ආයෝජන ක්‍රියාවලියට ප්‍රබල බලපෑමක් කරනු නිසැකය. එසේම චීනය ශ්‍රී ලංකාවේ දෙවැනි විශාලතම ආනයන හා සංචාරක සේවා වෙළෙඳපොළ වේ. එබැවින් චීනයේ ආර්ථික පසුබෑම ශ්‍රී ලංකාවට විශාල ගැටලුවක් වනු ඇත.



Visit EDUHUB

- ශ්‍රී ලංකාවේ විදේශ විනිමය ඉපයීම් සපයා දෙන තෙවැනි මූලාශ්‍රය සංචාරක ව්‍යාපාරයයි. ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංචාරක වෙළෙඳපොළවල් වසංගතයට ගොදුරු වීමත්, සංචරණ තහනම් කිරීමත් නිසා ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය දැඩි පීඩාවක් එල්ල කොට ඇත.

- ගෝලීය ඉල්ලුම පහළ වැටීමත් අවශ්‍යකරන අමුද්‍රව්‍ය ආනයන කිරීමේ ගැටලුවටත් මුහුණ පා සිටින ලක්ෂ පහකට ආසන්න පිරිසක් සේවා නියුක්තව සිටින ශ්‍රී ලංකාවේ ඇඟලුම් කර්මාන්තයද කෝවිඩ්-19 වසංගතය නිසා දැඩි අර්බුදයකට පත්ව සිටී.

- ගෝලීය මූල්‍ය වෙළෙඳපොළවල හටගෙන ඇති අස්ථාවර තත්ත්වයන්ද ශ්‍රී ලංකාවට අයහපත් ලෙස බලපෑමට පිළිවන. ශ්‍රී ලංකාවේ ණයබර ඉහළ යාමත් අයවැය හිඟය වර්ධනය වීමත් කරනකොට ගෙන විදේශීය මූල්‍ය වෙළෙඳපොළවලින් ණය ලබා ගැනීමට යාමේදී අසතුටුදායක කොන්දේසිවලට මුහුණදිය හැකිය.

**(එක් ආර්ථික බලපෑමකට ලකුණු 01 බැගින් ඕනෑම බලපෑම් පහකට ලකුණු 05 යි)**

(iii) - තිරසාර හා වේගවත් ආර්ථික වෘද්ධිය ශ්‍රී ලංකාව මගහැර ගොස් තිබේ. නිදහසින් පසු ගතවූ වසර 70 තුළ ශ්‍රී ලංකා ආර්ථිකය වර්ධනය වී ඇත්තේ වර්ෂයකට 4% ක් තරම් වූ සාමාන්‍ය අගයකිනි. ඉහළ ආර්ථික වෘද්ධියක් අත්කර ගෙන ඇත්තේ වසර කිහිපයකදී පමණි.

- 1950 ගණන් වලදී ආර්ථිකය වර්ධනය වූයේ 3% ක සාමාන්‍ය වේගයකිනි. 1960 ගණන් වලදී එය 4.7% ක් විය. 1970 ගණන් වලදී නැවතත් 3.9% ක් දක්වා පසු බැසීය. 1970 - 75 කාලයේ දී ඉතාමත් අඩු අගයක් වූ 2.9% ක් වාර්තා කළේය. 1980 ගණන් වලදී 4.3% ක් ද 1990 ගණන් වලදී 5.2% ක් ද වශයෙන් තරමත් ඉහළ අගයක් වාර්ත කළේය. නව සහශ්‍රකයේ ප්‍රථම දශකයේදී වර්ධන වේගය 5% ක් පමණ වූ අතර 2010 - 2014 කාලය තුළ වෘද්ධි වේගය 5.4% ක් විය. 2015 - 18 කාලයේ දී නැවතත් 3.5% ක් තරම් පහළ අගයකට වැටුණි. **(ලකුණු 02 යි)**

- ආර්ථික වෘද්ධිය පහළ බැසීමට බලපා ඇති හේතු :
  - ජනවාර්ගික ගැටුම් සහ සිවිල් යුද තත්ත්වයන්
  - ආර්ථික කරුණු ගැන අවධානය ඉවත් වී දේශපාලනික හා ආගමික කරුණු ගැන අවධානය යොමු වීම.
  - නිතර නිතර ආණ්ඩු වෙනස්වීමත් ඒ සමග ඇති වූ ප්‍රතිපත්ති වෙනස්වීම් හා ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ අවිනිශ්චිතතා හටගැනීම.
  - වඩාත් ප්‍රායෝගික ප්‍රතිපත්ති වෙනුවට දෘෂ්ටිවාද මත ප්‍රතිපත්ති තීරණය වීම.
  - ගෝලීය ආර්ථිකයේ ඉඩ ප්‍රස්තා යොදා ගනිමින් අපනයන ප්‍රවර්ධනයට අසමත් වීම.



Visit EDUHUB

- ශ්‍රම හමුදාවේ තාක්ෂණික නිපුණතා සංවර්ධනය නොවීම.

- අයහපත් වෙළෙඳ අනුපාත, ඉන්ධන මිල ඉහළ යාම්, ගෝලීය මූල්‍ය අර්බුද, අසතුටුදායක භූදේශපාලනික සංවර්ධනයන්

- බාහිර සාධක සහ අභ්‍යන්තර කම්පනයන් පහළ ආර්ථික සාධන මට්ටමට බලපෑම් ඇතිකළත් අභ්‍යන්තර ආර්ථික ප්‍රතිපත්ති වල දෝෂයන්ද එහිලා විශාල බලපෑමක් ඇතිකොට තිබේ. අභ්‍යන්තරාභිමුඛ ආර්ථික ප්‍රතිපත්ති කරා යොමුවීම, විවෘත ආර්ථික ප්‍රතිපත්ති පසුපසට හැරවීම මගින් ප්‍රතිපත්ති අවිනිශ්චිතතාවන් ඇතිකොට ඇති අතර ආයෝජකයන් වෙත අයහපත් සංඥා සපයා ඇත.

- අපනයන ක්ෂේත්‍රයේ මන්දගාමී වර්ධනය ශ්‍රී ලංකා ආර්ථිකය පසුබෑමට බලපෑ ප්‍රබලතම සාධකයකි. අපනයන වර්ධන වේගයට වඩා වේගයෙන් දළ දේශීය නිෂ්පාදිතය වර්ධනය වීම පෙන්නුම් කරන්නේ දේශීය ආර්ථිකය කේන්ද්‍ර කරගත් ප්‍රතිපත්ති තුළින් ආර්ථික වර්ධනය වේගවත් කරගත හැකි බවය. එහෙත් එය ඉතා කෙටි කාලයකට පමණක් සත්‍ය වන්නකි. දේශීය වෙළෙඳපොළ ඉතා සීමිත එකක් වන විට දේශීය ආර්ථික ක්‍රියාකාරකම් නගා සිටුවීමෙන් පමණක් ආර්ථිකය දිගු කාලීන වර්ධන මාවතට යොමු කළ හැකි නොවේ.

**(ඕනෑම කරුණකට ලකුණු 01 බැගින් කරුණු තුනකට ලකුණු 03 යි.)**

(iv) - ආර්ථික වෘද්ධිය ජනනය කිරීමට වඩාත් යෝග්‍ය වන්නේ පවත්නා තත්ත්වයට ගැළපෙන ප්‍රායෝගික ආර්ථික ප්‍රතිපත්ති මිස දෘෂ්ටි වාද මත එල්බ ගත් ප්‍රතිපත්ති නොවේ. නැගෙනහිර ආසියාතික රටවල සීඝ්‍ර ආර්ථික වර්ධනය පිටුපස දැකිය හැකි සත්‍යය වනුයේ ප්‍රතිපත්තිවල ප්‍රායෝගික භාවයයි. සීඝ්‍ර ආර්ථික වර්ධනය සඳහා විවෘත ආර්ථික ප්‍රතිපත්ති වඩාත් සුදුසු වෙතැයි හඳුනාගෙන විදේශීය ආයෝජකයන්ට ඔවුහු ඇරයුම් කළහ. ඒ අනුව අපනයනාභිමුඛ ආර්ථික වෘද්ධි උපාය මාර්ග සැකැසුණි.

- දෘෂ්ටිවාද මත එල්බ ගෙන සිටීමත්, ප්‍රායෝගික ප්‍රතිපත්ති ගැනීමට අසමත්වීමත් නිසා කාර්යක්ෂම ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාවට නැගීමට ශ්‍රී ලංකාව අසමත්වී තිබීම. අනික් අතට බලන විට අතීතයේ අභ්‍යන්තරාභිමුඛ ආර්ථික ප්‍රතිපත්ති අනුගමනය කළ බොහෝ සමාජවාදී රටවල් වර්තමානයේ නිදහස් ආර්ථික හා වෙළෙඳ ප්‍රතිපත්ති කරා යොමුව සිටින බවද සැලකිය යුතුය. **(ලකුණු 02 යි)**

- ශ්‍රී ලංකාව කාර්යක්ෂමතාව පදනම් කරගත් ප්‍රතිපත්ති වෙනුවට දෘෂ්ටිවාද පදනම් කරගත් ප්‍රතිපත්ති යොදාගත් බවට නිදහසින් පසු කාලය තුළ අත්දැකීම් මැනවින් පෙන්වා දෙයි. ඉතා හොඳ උදාහරණයක් වන්නේ ව්‍යාපාරික වතු ජනසතු කිරීමය. එහෙත් විශාල ලාභ උපයමින් භාණ්ඩාගාරයට බදු ආදායම් ලබාදුන් එම ව්‍යාපාර රාජ්‍ය හිමිකාරිත්වයට පත්වීමෙන් පසු විශාල අලාභ ලබන ඒකක බවට පත්විය. ඒවා නඩත්තු කිරීමට දිගින් දිගටම රාජ්‍ය භාණ්ඩාගාරයේ අරමුදල් සැපයීමටද සිදුවිය.

- එසේම රාජ්‍ය ව්‍යවසායන් 300 කට අධික ප්‍රමාණයක් අලාභ ලබමින් කටයුතු කරන බව වාර්තා වේ. දෘෂ්ටිවාද මත එල්බ ගැනීම නිසා ඒවා කාර්යක්ෂම ව්‍යාපාර බවට ප්‍රතිසංවිධානය කර ගැනීමට හෝ පෞද්ගලීකරණය කිරීමට හෝ පසුබට වී ඇත. එහි



Visit EDUHUB

ප්‍රතිඵල වශයෙන් වාර්ෂිකව භාණ්ඩාගාරයෙන් අරමුදල් සපයමින් පාඩු ලබන ව්‍යාපාර එලෙසම පවත්වා ගැනීමට සිදුව ඇත.

- පාඩු ලබන රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලීකරණය කිරීමට රජය මැළිවීමට විවිධ හේතු බලපායි. ජනප්‍රිය මතවාදයක් වී ඇත්තේ රජයේ දේපළ විකිණීම අපරාධයක් බවය. මහජනතාව වෙත ලබාදී ඇති අදහස වන්නේ පෞද්ගලීකරණය යනු රජයේ වත්කම් විකුණා දැමීමේ ක්‍රියාවක් ලෙසයි.

- මීට ඉහත කාලයක් රාජ්‍ය ව්‍යවසායන් රැසක් පෞද්ගලීකරණය කරන ලදි. ඒ අතර දූරකථන සේවය, ගුවන් සේවය, ගෑස් සමාගම විය. දූරකථන සේවය පෞද්ගලීකරණයෙන් පසු ඉතා විශිෂ්ට සේවා සපයන්නන් බවට පත්ව ඇත. ගුවන් සේවයේ කළමනාකරණ ක්‍රියාවලිය පෞද්ගලීකරණයට ලක්කිරීමෙන් විශාල ලාභයක් රජය උපයා ගත්තේය. පසුව රජය නැවතත් එය රජයට පවරා ගත් පසු විශාල අලාභ ලබන්නට පටන් ගෙගන ඇත.

- රාජ්‍ය ව්‍යවසායන්ගේ පැවැත්ම දේශපාලකයන්ට ඉතා වාසිදායකය. ඒවා දූෂිත ගනුදෙනු වලට හා හිතවතුනට රැකියා සැපයීමට ප්‍රබල දායකත්වයක් ලබා දෙයි.

- ශ්‍රී ලංකාවේ වෙළෙඳ ප්‍රතිපත්තිය ද මේ ආකාරයටම දෘෂ්ටිවාද පදනම් කරගත් එකක් මිස ලෝකයේ ප්‍රායෝගික තත්ත්වයන් හඳුනාගෙන සකසා ගත් එකක් නොවේ. 1977 දී නිර්බාධ වෙළෙඳ ප්‍රතිපත්තියකට ශ්‍රී ලංකාව අවතීර්ණ වූ නමුත් කල්යාමේදී එහි නිර්බාධභාවය සිඳීගොස් ඇත. නිර්බාධ වෙළෙඳාම හඳුන්වාදීමේදී ශ්‍රී ලංකාව 1977 දී දකුණු ආසියාවේ පුරෝගාමී රට බවට පත්වුවද වර්තමානය වන විට ශ්‍රී ලංකාව දැඩි ආරක්ෂණ වාදයට යොමු වූ රටක් වී ඇත. ආනයන මත බදු පැනවීමත් බදු මත තවත් බදු පැනවීමත් නිසා මේ තත්ත්වය පැන නැගී ඇත. ආනයනික යෙදවුම් මත දැඩි බදු පැනවීම මගින් නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රයේ අපනයන ප්‍රවර්ධනය දුෂ්කර ක්‍රියාවක් වනු ඇත.

**(එක් උදාහරණයකට ලකුණු 01 බැගින් උදාහරණ තුනකට ලකුණු 03 යි. මුළු ලකුණු 05 යි)**



Visit EDUHUB

# සටහන්



Visit EDUHUB